سنهالي

للمسلمين الجدد


سلسلة الهداية (3)

# ඉස්ලාමීය අධ්‍යාපනය

# الإسلام

## පළමු පොත

## الجزء الأول



මහාචාර්ය ඉබ්‍රාහිම් අමීනී

# ඉස්ලාමීය අධ්‍යාපනය

ආයතුල්ලාහ් ඉබ්‍රාහිම් අමීනී

පළමු පොත

شبكة الفكر
alfeker.net

Era of Appearance Foundation
مؤسسة عصر الظهور
E-mail:info@thohor.com
eaf-q8@yahoo.com
www.eaf-q8.com
www.thohor.com
P.O.Box:11111 Al-Dasma-Kuwait

الطبعة الأولى

1429هـ - 2008م

موبايل: 6703601 - 9796703 - 7662770 - (965+)

# පටුන


| | | |
|---|---|---|
| 1. | පෙරවදන | - 1 |
| 2. | ඔබ දකින හැම දෙය | - 3 |
| 3. | මේ සතුන් හඳුනා ගන්න | - 4 |
| 4. | මාළුවා | - 5 |
| 5. | මල් උයන තුළදී ලැබූ දෙවියන් ගැන උගත් පාඩමක් | - 7 |
| 6. | මේ පිරිමි දරුවාට යමක් දකින්නට හැකිද? | - 11 |
| 7. | කරුණාවන්තවූත් දයාබරවූත් අල්ලාහ් | - 15 |
| 8. | අල්ලාහ්ට තුති පුදන්න | - 16 |
| 9. | අල්ලාහ්ගේ ආශිර්වාදයන් | - 20 |
| 10. | මේ මිනිසා වැඩෙහි යෙදෙයි | - 22 |
| 11. | අල්ලාහ් ගේ නබිවරු | - 26 |
| 12. | අවසාන නබිවරයා | - 28 |
| 13. | ආගම යනු කුමක්ද? | - 31 |
| 14. | ශ්‍රේෂ්ඨ නබිවරු | - 33 |
| 15. | මුහම්මද් නබි( සල්) තුමාණන්ගේ ළමා කාලය | - 35 |
| 16. | ළමයින්ට කරුණාව දැක්වීම | - 37 |
| 17. | යහපත් ජීවිතයකට හොඳම ආගම ඉස්ලාමයය | - 40 |
| 18. | දැවුණු මිදි උයන | - 42 |
| 19. | ළමයින්ට ආදරය දැක්වීම | - 46 |
| 20. | ඉමාම් හසන් ( රලි) ගේ අමුත්තෝ | - 50 |
| 21. | සතුන්ට කරුණාවන්ත වීම | - 53 |
| 22. | යහපත් ක්‍රියාවන්හී යෙදෙන දරුවා | - 55 |
| 23. | කිසිවෙකුට කරදර නොකරන දරුවා | - 57 |

24. පිරිසිදුව සිටිමු - 59
25. අපි සලාතය ඉටු කරමු - 62
26. වු(ද්) ලූ දෝවනය - 64
27. ආහාර ගැනීමෙ සිරිත් - 67
28. ගුරුවරුන් සතු ගරුත්වය - 70
29. වැදගත් සෞඛ්‍ය උපදෙසක් - 73
30. වෙන්වීමෙ දිනය - 75

# පෙරවදන

ළමෝ මතු පරපුරෙහි මහඟුතම වත්කම වෙති. ඔවුන්ගේ අධ්‍යාපනය සහ ඔවුන් පුහුණු කිරීම සඳහාත් , ඔවුන් කෙරෙහි වන ගෞරවය, ආදරය සහ දයාව කෙරෙහිත් ඉස්ලාමය මගින් විශේෂ අවධානයක් යොමු කරනු ලැබ ඇත. ළමුන්ගේ අයිතිවාසිකම් සංරක්ෂණය පිළිබඳ ඉස්ලාමයේ සවිස්තර ලෙස සඳහන් කරනු ලැබ ඇති අතර අල්ලාහ් දෙවියන් නැමදීමෙහිත් මිනිස් වගට සේවය කිරීමෙහිත් අරමුණ ඉලක්ක කරගෙන ඔවුන්ට මනුෂ්‍යයන් වශයෙන් පිරිපුන් වීමෙහි ලා අවශ්‍ය වන මහ පෙන්වීම ඉස්ලාමය මගින් අවධාරණය කෙරෙයි.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් දරුවන්ගෙන් වැඩි සංඛ්‍යාවක් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන්නෝය. මෙනයින් මෙබඳු දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදුසු ඉස්ලාමීය පොත් සිංහලෙන් සකස් කිරීම වැදගත් අවශ්‍යතාවයක්වන අතර එයින් මෙබඳු පොත් ගැන උනන්දුවක් දක්වන සෙසු අය වෙනුවෙන්ද සේවයක් ඉටුවෙයි. ඉස්ලාමීය අධ්‍යාපනය ලබාදීමෙහි ලා සුදුසු පොත් ඉංග්‍රීසියෙන් සකස් කිරීමේ ප්‍රයත්නයක් කලින් දරන ලද නමුත් එය එතරම් සාර්ථක නොවුණි.

ඉස්ලාමීය සේවා සංවිධානය සුප්‍රකට දේව ධර්මවාදියෙකු සහ ඉරානයේ කුම් හී අල් හව්සා අල් ඉල්මියාහ් දේවධර්ම ධර්ම මධ්‍යස්ථානයේ වියත් මහාචාර්යවරයෙකු වන හුජ්ජතුල් ඉස්ලාම් ඊබ්‍රාහිම් අමිනි( මොහු ඉස්ලාමය පිළිබඳව පළවුණ වැදගත් පොත් රැසකම කතුවරයා වෙයි) විසින් දරුවන් වෙනුවෙන් විශේෂයෙන්ම ලියන ලද පොත් පෙළක් මෙසේ සිංහලෙන් ප්‍රකාශයට පත් කරනුයේ දැඩි තෘප්තිමත් හැඟීමකින් යුතුවය.

මෙම පොත් පෙළ සුගම බසින් ඉස්ලාමය පිළිබඳව දරුවන්ට ඉගැන්වෙන වෙනස් වෙනස් ආකාර පාඩම් වශයෙන් ලියවුණකි. සෑම පාඩමකම අවසානයේ ඒ ඒ පාඩම පිළිබඳ අධ්‍යයනය සහ පුහුණුව දරුවන්ට පහසු කරවන්නට උපකාර වන පරිදි ප්‍රශ්ණ සහ අභ්‍යාස සම්පාදනය කොට ඇත. මේ පොත් දරුවන්ට ප්‍රිය ජනක වන පරිද්දෙන් චිත්‍ර ද අඩංගු කොට තිබේ. පොත් සතරකින් යුත් මේ පොත් පෙළ මගින් දරුවන් සඳහා අවශය ඉස්ලාමීය අධ්‍යාපනය ඔවුන් ගේ මනස් කෙත් වල වරනු වස් ප්‍රයත්නයක් දරනු ලැබ ඇත්තේය.

මෙම පොත් පෙළ අදල කවුරුනුත් විශේෂයෙන්ම දරුවන්, දෙමාපියන් සහ ගුරුවරුන් විසින් පිළිගනු ලැබෙනු ඇතිය යනු ඉස්ලාමීය සේවා සංවිධානයේ බලාපොරොත්තුවයි. එමෙන්ම ඔවුන්ගේ එලදයි යෝජනාවන් මෙම පොත් පෙළේ මතු සංස්කරණයන් විධිමත් කරගැනීමෙහි ලාත්, සංශෝධනය කර ගැනීමෙහිලාත් ප්‍රයෝජනවත් වනු ඇතැයි අපි හඟිමු.

**ඉස්ලාමීය සේවා සංවිධානය**

## පළමුවැනි පාඩම

# ඔබ දකින හැම දෙය

ඔබ දකින හැම දෙය  ඔබ යනෙන හැම තැන
අල්ලාහ් මවන ලද  බව හොඳින් දැනගනු මැන

ඉර සඳ දුවලද  රැය සමඟ තරු එළියද
ගස්වැල් සහ පල ද රෝස , අරලිය මල් ද සුවඳ ද

කතරද , වන ගැබ ද  උස් කඳු ද ගංගාවද
අහස සහ බිම් මැද සොබා දම නම් මහ පොත
[illegible] ගේම මැවුමය. ඔහුට ඇති බල නිම නැත



**අභ්‍යාස**

1. මේ කවිය කටපාඩම කර ගන්න
2. එය ඔබේ යහළුවන් සමඟ එක්ව ගයන්න.

## දෙවැනි පාඩම

# මේ සතුන් හඳුනා ගන්න

මෙ සතුන්ගේ පින්තූර දෙස බලන්න.

උන්ගේ නම මොනවාද?


උන් අතුරින් ඔබ දැක ඇති සතුන් කවුරුන්ද?

උන් ජීවත් වන්නේ කොහිද?


ලස්සනම සතුන් කවුරුන්ද?

ඔබ කැමතිම සතා කවුද?

උන් මවන ලද්දේ කා විසින්ද?








## තුන්වැනි පාඩම

# මාළුවා

ඔබේ ගෙදර මාලුවෝ සිටින්ද?

ඔබ මාළුන්ට කැමතිද?

මාළුන් ජීවත්වන්නේ කොහිද?

මාළුවෙකු දිය තුළ පිහිනන්නේ කෙසේද කියා ඔබ දන්නෙහිද?


මාළුන්ට වරල් නොවුණි නම් ඔවුන්ට පිහිනන්නට හැකිවේද?

මාළුන්ගේ වරල් ඔවුන් විසින්ම මවාගන්නා ලද්දේද?

නැත, මාළුන් විසින්ම තමන්ගේ වරල් මවාගන්නා ලද්දේ නැත. ඒ වාගේ ම වෙනත් සතෙකු විසින් ඔවුන්ට වරල් ලබා දෙන ලද්දේද නැත.

සැබැවින්ම මේ ලස්සන සතුන් වර්ගයට වරල් අවශ්‍ය බව දැනගත් කරුණාවන්තවූද දයාබර වූද දෙවියන් විසින් ඔවුන් වරල් සහිතව මවන ලදි. ඒ නිසා ඔවුන්ට දිය තුළ පිහිනන්නට හැකිය.







**අභ්‍යාස**

අ. මේ ප්‍රශ්න සම්පූර්ණ කර ඔබේ මිතුරන්ගෙන් ඒවාට පිළිතුරු ලබාගන්න.

1. මාළුන්ට දිය තුළ ............................උදව් කරන්නේ මොනවාද

2. මාළුවෙකු දැක්වෙන මේ .................... ඇති වරද කුමක්ද?

3. මාළුවෙකුට තමාගේ ....................... නැතිව පිහිනන්නට හැකිද?

4. මාළුවා තමන් විසින්ම උගේ ..................... මවා ගන්නා ලද්දේද?

5. මාළුවාට.......... පිහිනීම සඳහා උගේ වරල් ලබාදුන්නේ කවුද?

6. මේ මාළුවාගේ වරල් අඳින්න.

මාළුවා විසින් ම තමන්ගේ වරල් ඇඳ ගන්නා ලද්දේද?


## සතරවැනි පාඩම

# මල් උයන තුළදී දෙවියන් ගැන උගත් පාඩමක්

දවුද් සහ සෙයියිද් ඔවුන්ගේ පියා සමඟ එළිමහනේ ගත කරන්නට මල් වත්තකට ගියහ. එහි කොල පැහැති උස ගස් , සරුසාර හරිත තැනිතලා සහ විවිධ පාට මල් ද වුණි. මල් වත්ත මැදින් දිය දහරාවක් ගලා ගිය අතර තාරාවෝ සහ හංසයෝ එහි පිහිනමින් සිටියහ. තාරාවෝ දිය තුළ නිදැ ල්ලේ පිහිනමින් සිටි අතර, වරින් වර ඔවුන්ගේ හිස් දිය තුළට ඔබමින් යමක් අල්ලා ගෙන එය කන්නට වූහ.

''සෙයියිද්!'' දවුද්, තම සොහොයුරාට කතා කළේය. ''පිහිනීම ඔවුන්ට කොතරම පහසු දෙයක්ද කියා බලන්න. ඔබටත් එසේ පිහිනන්නට හැකි නම ඔබ කැමතිද?''

'අර දියෙන් ගොඩට මතුවූ තාරාවා දෙස බලන්න. ඌ උගේ තටු සොළවන



හැටි බලන්න. උගේ දෙපා දෙස බලන්න. ඒවා කිසි විටෙකත් දියෙහි නොගැවුණ තරමට වියළිය. අර තාරාවා දෙස බලන්න. ඌ පියාඹා ඉවත යන හැටි බලන්න. උගේ පියාපත් තෙත බරිත නම් ඌට එලෙස පියාඹා යෑමට නොහැකිය.

සෙයියිද් තරාවන් දෙස බලා මෙසේ කීවේය. ''ඔබ හරි. තාරාවන්ගේ පියාපත් දියෙන් තෙත් වන්නේ නැත. නමුත් ඊට හේතුව මට නොතේරේ. අපි ගොස් තාත්තාගෙන් අසමු.''

දවුද් සහ සෙයියිද් ඔවුන්ගේ පියාවෙතට දුව ගොස් මෙසේ ඇසුවෝය. ''තාත්තේ, ටිකක් මෙතැනට ඇවිත් තාරාවන් දිය තුල පිහිනන හැටි බලන්න; උන්ගේ පියාපත් දියෙන් තෙත් නොවන හැටි බලන්න! තාරාවන්ගේ පියාපත් තෙතබරිත නොවන්නේ මන්දැයි අපට කියා දෙන්න.''

සියල්ලෝම දිය දහරාව අද්දරට ගියහ. දරුවන්ගේ පියා මෙසේ කියන්නට වුණි. ''බොහෝම හොඳයි මන්ද ඔබට දැන් යමක් තේරුම් ගන්නට ඕනැවී තිබෙනවා. මිනිස්සු තමන් දකින දේ සිතින්ද කල්පනා කළ යුතු වෙති . තමන් දකින දෙයක් ගැන තමන්ට නොතේරෙන කල ඔවුහු ඒ ගැන දන්නා යමෙකුගෙන් අසා දැන ගත යුතු වෙති. ඔවුන්ගේ දනුම වැඩෙන්නේ එවිටයි.''



තාරාවන්ගේ පියාපත් දියෙන් තෙත් නොවන්නට හේතුව ඒවා තෙල් සහිත වීමයි. තාරාවන්ගේ පියාපත් තෙල් සහිත නොවී නම් ඒවා තෙත බරිත වන අතර එයින් ඔවුන්ට දියෙහි පිහිනන්නට හෝ අහසේ පියාඹා යන්නට බාධා කෙරෙයි.''

''තාත්තේ'' සෙයියිද් කීවේය. ''තාරාවන් ගැන එපමණ සිතුවේ කවුද? ඇත්ත වශයෙන්ම තාරාවා පවා උගේ පියාපත් තෙල් සහිත කරගන්නා ක්‍රමය නොදෙන්නේ නොවේද?''

තාත්තාගේ පිළිතුර වූයේ මෙයයි.''සියළු දෙය මැවූ සියල්ල දන්නාවූ කරුණාබර අල්ලාහ් තාරාවන් ගැන සිතා ඇත. අල්ලාහ් විසින් තාරාවා දිය තුළ පිහිනිය හැකි පරිදි මවන ලදී. මේ නිසා ඔහු උගේ පියාපත් සෑම විටම තෙල් සහිත වන පරිදි මැවුවේය. එවිට ඌට පහසුවෙන් දිය තුළ පිහිනන්නටත් , අහසෙහි පියාඹා යන්නටත් හැකිය.

**ප්‍රශ්ණ**

1. තාරාවා දියෙන් ඉවතට එද්දී දවුද් තම සොහොයුරාට කීවේ කුමක්ද?
2. සෙයියිද් ඊට දුන් පිළිතුර කුමක්ද?

3. ඔවුහු ඔවුන්ගේ පියාගෙන් කුමක් ඇසුවෝද?

4. ඔවුන්ගේ පියා ඔවුන්ට කීවේ කුමක්ද?

5. ඔබ යමක් ගැන නොදන්නෙහි නම් කුමක් කළ යුතුද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. මෙ පියාපත් දෙස බලන්න. ඒවා කිසි විටෙකත්.......................වී නැති බවක් පෙනේ.

2. ඇත්ත වශයෙන්ම තාරාවාගේ පියාපත් දිය ............................නොගන්නට හේතුව කුමක්ද?.

3. බොහෝම හොඳයි, මන්ද ඔබට යමක් ඕනෑවී තිබෙනවා

4. සියල්ල දන්නාවූත් කරුණාබරවූත් දෙවියන් විසින් ................................ මෙසේ මවන ලදී.

## පස්වැනි පාඩම

# මේ පිරිමි දරුවාට යමක් දකින්නට හැකිද?

මෙ පිරිමි දරුවාට යමක් දකින්නට හැකිද?

අපට දැස් නොවුණි නම් අපි කුමක් කරමුද?



අපට දකින්නට දුවන්නට සහ ක්‍රීඩා කරන්නට හැකිද?

පිරිමි දරුවන් දෙදෙනාගෙන් දුවන්නට නොහැකි දරුවා කවුද?

ඔහුට දුවන්නට නොහැකි ඇයි?

ඔහුට සෙල්ලම් කළ හැකිද?

අපට දෙපා නොවුණි නම් අපි කුමක් කරමුද?

අපට ඇවිදින්නට දුවන්නට සහ ක්‍රීඩා කරන්නට හැකිද?



බෝලය අහුලා ගත නොහැක්කේ මෙ පිරිමි දරුවන් දෙදෙනාගෙන් කාටද?

ඔහුට කෑම කන්නට හැකිද?

ඔහුට කෑම කන්නට නොහැකි ඇයි?

අපට දෑත් නොවුණි නම් කුමක් කරමුද?

අපට දෑස්, දෙකන් දෑත් සහ දෙපා දෙනු ලැබ ඇත්තේ කා විසින්ද?
අල්ලාහ් අපට යමක් දකින්නට දෑස් ලබා දුන්නේය.

යමක් අසන්නට දෙකන් ලබා දුන්නේය.

කතා කරන්නට දිවක් සහ මුවක් ලබා දුන්නේය.

ඇවිදින්නට දෙපා ලබා දුන්නේය.

වැඩ කරන්නට දෑත් ලබා දුන්නේය.

**දයාබර වූ අල්ලාහ්**

අල්ලාහ් අපට ආදරේය. ඒ නිසා ඔහු අප මවා අපට මේ සියළු ආශීර්වාද ලබා දී ඇත.

ඔහු අපට දුන් දෑසින් අපි දකිමු. දෙකනින් අපි අසමු. දිවෙන් මනා ලෙස කතා කිරීමත් නොයෙක් දෑ රස විඳීමත් කරමු. දෙපයින් ඇවිදිමු. දෑතින් වැඩ කිරීමත් අනුන්ට උපකාරී වීමත් කරමු. සිහි බුද්ධියෙන් හොඳ නරක දෙක තේරුම් ගනිමු.

අපට දෑස්, දෙකන්, දිව, දෑත් දෙපා, සහ සිහි බුද්ධිය නොවුණි නම් අප ජීවත් වන්නේ කෙසේද?

**ප්‍රශ්ණ**

1. අපි අපේ දෑසින් කුමක් කරමුද?

   අපට දෑස් නොවුණි නම් කුමක් වනු ඇතිද?

2. අපි අපේ දෙකනින් කුමක් කරමුද?

   අපට දෙකන් නොවුණි නම් කුමක් වනු ඇතිද?

3. අපි අපේ දිවෙන් කුමක් කරමුද?

   අපට දිවක් නොවුණි නම් කුමක් වනු ඇතිද?

5. අපි අපේ දෙපයින් කුමක් කරමුද?

   අපට දෙපා නොවුණි නම් කුමක් වේද?

6. අපි අපේ සිහි බුද්ධියෙන් කුමක් කරමුද?

අපට සිහි බුද්ධිය නොවුණි නම් කුමක් වනු ඇතිද?

7. මෙ සියළු ආශිර්වාද අපට දෙන ලද්දේ කා විසින්ද?

8. අල්ලාහ් අපට ආදරේද?

9. අල්ලාහ් අපට ආදරේ බව ඔබ දැන ගන්නේ කෙසේද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. අල්ලාහ් අපව........ඔහු අපට...............නිසාය.
2. ඔහු අපට දිවක් දුන්නේ...........ත් ආහාර වල රස විඳින්නටත්ය.
3. ඔහු අපට දැත් දුන්නේ..........ත් අනුන්ට............ත්ය.
4. ඔහු......................සිහි බුද්ධිය.................................හා නරක තේරුම් ගන්නටය.



## හයවැනි පාඩම

# කරුණාවන්තවූත් දයාබරවූත් අල්ලාහ්

කරුණාවන්තවූත් දයාවන්තවූත් අල්ලාහ්
මිනිස් අපට දිවකුත් මුවකුත් දුන්නා.
සිහි බුද්ධිය ඔහු අප හට දුන්නා
කෑම බීම අප වෙත ගෙන දුන්නා.
සිතකය ආත්මය අප වෙත ලබා දුන්නා
දෙකන් දැස් හා ඇඟිලි ද දුන්නා
අප තරමින් කවරෙකු වූවේ වුව
අල්ලාහ් ලැබ දුන් ආශිර්වාදය
ගැන අප හට තුති පුදනු අසීරුය

**අභ්‍යාස**

1. මෙ කවිය මතකයෙහි තබා ගන්න.

2. ඔබේ පංතියේ අනෙක් දරුවන් සමඟ එක්ව එය ගායනා කරන්න.

3. ඔබේ ලස්සනම අත් අකුරින් මෙ කවිය පිටපත් කරන්න.

## හත්වැනි පාඩම

# අල්ලාහ්ටම තුති පුදන්න

මගේ මාමා ජීවත් වන්නේ කඳුකරයේ කුඩා ගම්මානයකය. ප්‍රධාන පාරෙන් සැතපුම් පහක් පමණ දුරින් පිහිටි එය ඉතා රමණීය ගම්මානයකි.

''මාමා බලන්නට අපි ඔහුගේ ගමට යමු.'' දිනක් මගේ පියා කීවේය.'' එහිදී අපට පිරිසිදු වාතාශ්‍රය විඳින්නට පුළුවන්''

අපි ඒ අසා බොහෝ ප්‍රීතියට පත්වූ අතර එසේ යෝජනා කිරීම ගැන පියාට ස්තුති කළෙමු.

එක් හිමිදිරි උදෑසනක මගේ සහෝදරයා, සහෝදරිය සහ මම අපේ මව සහ පියා ද සමඟ බස් නැවතුම් පොළට පැමිණ බසයකට ගොඩවීමු. බසය ටික දුරක් ගමන් කළ තැන මගේ පියා මෙසේ කීවේය.

''අපි මෙතනින් බසිමු. මාමාගේ ගෙදරට මෙතැන සිට සැතපුම් පහක් පමණ දුර ඇති. අපට එහි යන්නට වෙන්නේ පයින්.''

බසයෙන් බැස ගත් පසු මගේ සහෝදරයා, සහෝදරිය සහ මම එකිනෙකාට කලින් මාමාගේ ගෙදරට ළඟාවන්නට මෙන් දුවන්නට වීමු. සෑහෙන දුරක් දිව ගිය ද අපි තවමත් ගම්මානයට පැමිණ සිටියේ නැත. ඉතින් අපි මවත් පියාත් එනතුරු මදක් නතරවී සිටිය ද ඔවුන් පැමිණියේ නැත. අපට මහ වැරදී තිබුණි. ඒ අතටත් මේ අතටත් කොතරම් දිවුවද අපට ගම්මානය සොයාගත නොහැකි විය. දිවීමෙන් අපි ද ැඩි වෙහෙසෙට පත්වී සිටියෙමු. ඉවසිය නොහැකි පිපාසයක්ද



දැඩි මහන්සියක්ද අපට දැනෙන්නට විය.

තව දුරටත් ඇවිද ගැනීම පවා අසීරු බව අපට දැණුනි. වෙහෙස බඩගින්න හා පිපාසයෙන් පීඩිත වූ අපි බිම වාඩි ගතිමු. බඩගින්නෙන් හා පිපාසයෙන් අප මිය යතැයි හැඟුණ අපට කෑ ගසා හඬන්නට සිතුණි. අපට උපකාර වන මෙන් අපි අල්ලාහ්ට යාඥා කරන්නට විමු.



හදිසියේම බූරුවෙකු පිට නැඟ ගත් මහළු මිනිසෙක් කන්දක් පිටුපසින් මතු විය. බූරුවා මතින් බිමට බැස ගත් ඔහු තමන් ළඟ තිබූ ජෝගුවකින් අපට බොන්නට වතුර දුන්නේය. වතුර ඒ තරම් රස බව ඊට පෙර අපට දැනී තිබුණේ නැත. අපේ සිත තුළවූ බිය මදක් පහව ගියේය. ඒ මහළු යහපත් මිනිසා රෙදි කඩක ඔතාගෙන තිබූ ආහාර වර්ගයක්ද අපට දුනි.

ඒ පාන් සහ කේජු විය. කේජු සමඟ පාන් කෑමෙන් පසු අපේ ඇඟට යළිත් සවියක් දැණුනි. එමෙන්ම ඒ පාන් සහ කේජු බොහෝ රසවත් විය. මහළු මිනිසා අපව සතුටු කරවා අපේ ශක්තියත්, විශ්වාසයත් යළි ලබා දුන්නේය. දැන් අපට හොඳින් කතා කරන්නටත් ඇවිදින්නටත් හැකියි. වතුර වලත් , ආහාරවලත් වටිනාකම මට දැනුණේ ඒ



අවස්ථාවේ දීය. අපි මහළු මිනිසාට ස්තුති කළෙමු.

"දයාබර ළමයිනි", ඔහු අපට කතා කළේය. " අප වෙනුවෙන් ආහාර හා වතුර මැවූ අල්ලාහ්ට තුති පුදන්න. ආහාර හා වතුර නොවී නම් අපි අපේ ජීවිත රැක ගන්නේ කෙසේද? ඇවිදින්නටත් වැඩ කරන්නටත් අපට හැකි වන්නේ කෙසේද? අපි අනිවාර්යයයෙන්ම අල්ලාහ්ට තුති පිදිය යුතු වෙමු. ඔහුගේ ආශිර්වාදයන් අගයකළ යුතු වෙමු. ඔහුගේ අණ පනත් පිළිපැදිය යුතු වෙමු."

ඊළඟට මහළු මිනිසා අප බූරුවා මත තබාගෙන අපේ මාමාගේ ගම්මානය කරා කැඳවාගෙන ගියේය. ඔහුට ස්තූති කළ අපි මාමාගේ නිවස දෙසට වේගයෙන් දුවන්නට වීමු.

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. ළමුන් තිදෙනා පොළොව මත වැතිරුණේ ඇයි?

2. ඔවුන් දුටු මහළු මිනිසා කුමක් කළේද?

3. ඔහු ඔවුන්ට දුන්නේ මොනවාද?

4. ඔවුන් මහළු මිනිසාට ස්තූති කළේ ඇයි?

5. මේ මහළු මිනිසා ඔවුන්ට කුමක් කීවේද?

මේ ළමුන් දෙස බලන්න. ඔවුන් අඩ සිහියෙන් පොළොව මත වැතිරී සිටින්නේ ඇයි?

මීට කලින් ඔවුන්ට දිවීමෙ හැකියාව තිබීමට හේතුව කුමක්ද?

ඔවුන්ට කුමක් සිදුවීද?

ආහාර හා වතුර නැතිව ඔවුන්ට යළිත් පළමු තත්ත්වයට පත්විය හැකිව තිබුනේද?

ඔවුන්ට ආහාර හා වතුර දුන්නේ කවුරුන්ද?

අප වෙනුවෙන් ආහාර හා වතුර මැවුවේ කවුද?

## අටවැනි පාඩම

# අල්ලාහ් ගේ ආශිර්වාදයන්

අල්ලාහ් බොහෝ කරුණාවන්ත වන අතර ඔහු අපට නොයෙක් ආශිර්වාදයන් ලබා දී ඇත. ඔහු අපට ආශ්වාස කරන්නට වාතය මැවූවේය. ඔහු අපට පානය කරන්නටත්, දෝවනය කරන්නටත්, වතුර මැවූවේය.

ඔහු අපට මිහිරි රසැති පළතුරු ආහාරයට ගන්නටත් හොඳ ආහාර සාදගන්නටත් ගස් හා පැල මැවූවේය.

වාතය, වතුර, ගස් හා පැල නොවුණි නම් අපට ජීවත් විය හැක්කේ කෙසේද? එවැනි යහපත් ආශිර්වාද අප වෙනුවෙන් මැවිය හැකිව තිබුණේ අල්ලාහ් හැරෙන්නට අන් කවරෙකුටද?

මෙ ආශිර්වාද අප වෙනුවෙන් මවන්නට තරම් අල්ලාහ් දයාබර වන්නේය. කරුණාවන්ත වන්නේය.

ඒ නිසා අපි අල්ලාහ්ට ආදරය කරමු. ඔහුට තුති පුදමු. මෙ ලෝකය තුළ සතුටින් කල් ගෙවන්නටත් එයින් පසු සතුට ලබා ගන්නටත් අපි ඔහුගේ අණපනත් අනුගමනය කරමු. දුප්පතුන්ටත්, පීඩිතයන්ටත් අපි උපකාර කරමු. එලෙසින්ම අල්ලාහ් ගේ සේවකයන්ගේ සතුට සහ දියුණුව වෙනුවෙන් වෙහෙසවී වැඩ කරමු.

**ප්‍රශ්ණ**

1. අල්ලාහ් අප කෙරෙහි දයාබර වන වග සහ අපට කරුණාවන්ත වන වග අප තේරුම් ගන්නේ කෙසේද?

2. අපි දෙවියන්ට තුති පුදන්නේ ඇයි?

3. අල්ලාහ් ගේ ආශිර්වාදයන් පහක් නම් කරන්න.

4. ජීවිතය සාර්ථක කර ගන්නටත්, සතුටින් ජීවත් වන්නටත් අප පිළි පැදිය යුත්තේ කාගේ උපදෙස් ද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. අල්ලාහ්.................. හා ..........................වන නිසා අප වෙනුවෙන් බොහෝ ආශිර්වාද ඔහු විසින් මවනු ලැබ ඇත.

2. අපට..................... ට වාතයත්,..............................ට වතුරත් ඔහු විසින් මවනු ලැබ ඇත.

3. මෙ නිසා කරුණා බර වූ අල්ලාහ්ට...........................මු.

4. සදකාලිකව.................. ජීවත් වෙන අදහසින් අපි අල්ලාහ් ගේ උපදෙස්..........................

## නවවැනි පාඩම

# මේ මිනිසා වැඩෙහි යෙදෙයි

මෙ මිනිසා වැඩෙහි යෙදෙයි

ඔහු බීජ වපුරන්නේය.

ටික කළකින් මෙ බිම පුරා සරු තිල්ලක් වැවෙනු ඇත.

ගිම්හාන ඍතුවේදී ඔහු අස්වනු වශයෙන් නෙළා ගන්නේ මොනවාද?

සෑම යහපත් කටයුත්තකටම යහපත් ප්‍රතිඵලයක් ද ඇත.

යහපත් දේ කරන උදවියට අල්ලාහ් ආදරය කරයි.

මෙ මිනිසා කිසිදු වැඩක් නොකරයි.

කිසි දෙයක් වපුරන්නට ඔහුට වුවමනාවක් නැත.

ගිම්හාන ඍතුවේදී ඔහුට නෙලා ගත හැක්කේ මොනවාද?

ඔහුගේ ඉඩම තිල්ලෙන් වැසී සරුසාර වන්නේද?

යහපත් දේ නොකරන උදවිය ගැන අල්ලාහ් තුළ කැමැත්තක් නැත.

### මී ළඟ ලෝකය

මිනිස්සු වර්ග දෙකකට අයත් වෙති.

ආගමික දේ කෙරෙහි කැපවුණ යහපත් මිනිසුන් ඉන් එක් වර්ගයකි. අනෙක් වර්ගයට ආගමක් නැත. ඔවුන් කරන්නේ අයහපත් දේය. මෙ දෙවර්ගයම එක හා සමානද? යහපත් දේ කරන උදවියත්



අයහපත් දැයෙහි යෙදෙන උදවියත් එක හා සමාන ලෙස අල්ලාහ් දකියිද? යහපත් දේ කරන උදවියට ඒ වෙනුවෙන් තිළිණයක් නොලැබේද? අයහපත් දැයෙහි යෙදෙන උදවියට දඬුවමක් නොලැබේද? එසේ සිතීම කිසිසේත් වැරදි නොවේ.

"යහපත් දැයෙහි යෙදෙන උදවියත් අයහපත් දැයෙහි යෙදෙන උදවියත් මම එක හා සමාන ලෙස නොදකිමි. යහපත් දැයෙහි යෙදෙන අයට මම රමණීය තිළිණයක් පිරිනමමි. අයහපත් දැයෙහි යෙදෙන උදවියට මම දඬුවම් ලබා දෙමි." යයි අල්ලාහ් අපට කියන්නේය.

එය සත්‍යයකි. මීළඟ ලෝකය යනුවෙන් හැඳින්වෙන තවත් ලෝකයක් සර්ව බලධාරී අල්ලාහ් සතුවෙයි. මිනිසෙකු මිය ගිය විට ඔහුට ඒ ලෝකයට යන්නට සිදුවන්නේය. අප යහපත් දෑ කරමින් දෙවියන්ගේ අණට කීකරුව ක්‍රියාකළොත් මීලඟ ලෝකයේදී අපට තිළිණ ලැබෙනු ඇත. සම්පූර්ණ ප්‍රීතිය හා ප්‍රමෝදය ඇති ස්වර්ගයෙහි ජීවත් වීමට අපට අවස්ථාව උදවනු ඇත.

නමුත් අපි ආගම නොසලකා හැර අයහපත් දෑ කරන්නේ නම් ද, අල්ලාහ් ගේ උපදෙස පිළිපදින්නේ නැති නම් ද අපේ අයහපත් ක්‍රියා

වලට අපට දඬුවම් ලැබෙන අතර මීළඟ ලෝකයේදී අහිතකර හා දුෂ්කර ජීවිතයක් ගෙවන්නට අපට සිදුවනු ඇත. අල්ලාහ් යහපත් උදවියට රමණීය තිළිණයක්ද අයහපත් දෑ කරන අයට බියකරු දණ්ඩනයක් ද ලබා දෙයි.

**ප්‍රශ්ණ**

1. යහපත් දෑ කරන උදවියත්, අයහපත් කටයුතු වල යෙදෙන අයත් අල්ලාහ් එක හා සමාන ලෙස දකින්නේද?
2. අප යෙදෙන ක්‍රියාවලට සම්පූර්ණ තිළිණයක් අල්ලාහ් ගෙන් ලැබෙන්නේ කොහිදීද?
3. යහපත් මිනිසුන් මීළඟ ලෝකයේදී ජීවත් වන්නේ කවර අයුරින්ද?
4. අයහපත් මිනිසුන් ගැනකිවහැක්කේ කුමක්ද?
5. යහපත් ක්‍රියාවල යෙදෙන අයට අල්ලාහ්ගෙන් ලැබෙන තිළිණය කුමක්ද?
6. අයහපත් දැයෙහි යෙදෙන, මිනිසුන්ට කරදර කරන උදවිය ලබනතිළිණය කුමක්ද?
7. අප සියල්ලන්ම අල්ලාහ් ගේ උපදෙස් අනුගමනය කරන්නේ නම් මීලඟ ලෝකයේදී අපට ලැබෙන්නේ කවර ආකාරයේ ජීවිතයක්ද?
8. අප අයහපත් දෑ කරන, අකීකරු උදවිය නම් අපට කවර ආකාරයේ ජීවිතයක් ලැබෙන්නේද?
9. ස්වර්ගයට යන්නේ කවර ආකාරයේ උදවියද ?
10. අපායට යන්නේ කවර ආකාරයේ උදවියද?

**මෙ වාක්‍යය සම්පූර්ණ කරන්න**

1. මිනිස්සු වර්ග දෙකක් වෙති. එක් වර්ගයක්.............. .............අතර අනෙක් වර්ගය ..................යෙදෙන අයයි.
2. යහපත් උදවියත්, අයහපත් දෑ කරන උදවියත් දෙවියන්ට................නොවෙති.
3. සර්ව බලධාරී අල්ලාහ් සතුව ............ යයි හැඳින්වෙන තවත් ලෝකයක් ඇත.
4. අයහපත් දෑ කරමින් අල්ලාහ් ගේ උපදෙස් පිළිපදිමින් සිටින්නේ නම් මීළඟ ලෝකයේදී අපට........ජීවත්වන්නට ලැබෙනු ඇත.

5. එලෙසින්ම අප අයහපත් දැයෙහි යෙදෙමින් අල්ලාහ් ගේ උපදෙස් පිළිපදින්නේ නැතිනම් මිළඟ ලෝකයේදී අපට.................. හා ......ජීවිතයක් ගෙවන්නට සිදුවනු ඇත.

## දහවැනි පාඩම

# අල්ලාහ් ගේ නබිවරු

නබිවරු නම් අල්ලාහ් විසින් විශේෂයෙන්ම තෝරාගන්නා ලද ශ්‍රේෂ්ඨ පුරුෂයන්ය.

නබිවරු අල්ලාහ් ගේ පණිවුඩය ජනතාවට දේශනය කරන අතර මෙලොවටත් , මීළඟ ලෝකයටත් යන දෙලොව සඳහාම මිනිසුන්ට අවශ්‍ය වන වැදගත්ම පාඩම් ඔවුන්ට කියාදෙමින් යහපත්ම අයුරින් ජීවිතය ගතකරන්නට මඟ පෙන්වා දෙති.

නබිවරුන්ට මෙපාඩම් ඉගැන්වූයේ කවුරුන්ද?

නබිවරුන්ට මේ පාඩම් ඉගැන්නුයේ අල්ලාහ්ය. මෙලොවදීත් මීළඟ ලෝකයේදීත් සතුටිනුත් සහනයෙනුත් ජීවත්වනු පිණිස යහපත් දැයෙහි යෙදෙන ලෙසත් අයහපත් දැයෙන් වළකින ලෙසත් ජනතාවට අණ කරන මෙන් අල්ලාහ් ඔවුන්ට පවසා තිබේ.

නබිවරු කරුණා බර වූ එකම දෙවිඳනන්ට වන්දනා කරන්නටත් යහපත් ක්‍රියාවන් හී යෙදෙන්නටත් මිනිසුන්ට ආරාධනා කරති. ඔවුහු මිනිසුන්ට මෙසේ පවසන්නෝය.

'එකිනෙකාට කරුණාවන්ත වන්න. අල්ලාහ් ගේ මිතුරන්ට ආදරය කරන්න. අල්ලාහ් ගේ සතුරන්ට විරුද්ධ වන්න. කෲර පාළකයන්ට එරෙහිව සටන් කරන අතර පීඩිතයින්ට ආධාර ලබා දෙන්න.''

නබිවරු මිනිස් වර්ගයාගේ නායකයෝ සහ මාර්ගෝපදේශකයෝ වෙති.

මිනිසුනට නායකයෙකු හෝ මඟ පෙන්වන්නෙකු නොවූණි නම්

ඔවුන් යහපත් මාර්ගය සොයා ගන්නේ කෙසේද?

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. නබිවරුන් තෝරාගනු ලැබ ඇත්තේ කා විසින් ද?
2. නබිවරුන් ට පවරනු ලැබ ඇති මෙහෙවර මොනවාද?
3. නබිවරුන් විසින් මිනිසුන්ට උගන්වෙන්නේ කවර පාඩම්ද?
4. නබිවරුන්ට මෙ පාඩම් උගන්වනු ලැබ ඇත්තේ කා විසින්ද?
5. නබිවරුන්ට පවරා දෙනු ලැබ ඇති අණ කුමක්ද?

**මේ වාක්‍යය සම්පූර්ණ කරන්න.**

1. නබිවරු මිනිසුන්ට........ත් යහපත් ක්‍රියාවන්හී යෙදෙන්නටත් ආරාධනා කරති.

2. නබිවරු මිනිසුන් යහපත්ම.................කෙරෙහි යොමු කරවති

3. නබිවරු අපගේ කරුණාබරවූ අල්ලාහ්...............ජනතාවට දේශනය කරති.

එකලොස් වැනි පාඩම

# අවසාන නබිවරයා

අපගේ නබිතුමාණන් වන මුහම්මද් (සල්) තුමාණෝ අල්ලාහ් ගේ නබිවරුන් අතරින් අවසානතමයාය. එතුමා උපන්නේ අරාබියේ මක්කාව නම් නගරයෙහිය. එතුමෝ එහි ජනතාව අතර පුරා හතලිස් වසරක් ජීවත් වූවෝය. අල්ලාහ් විසින් තමන්ගේ නබිවරයාණන් හැටියට එතුමෝ තෝරාගන්නා ලදී. ජීවිතයේ සැබෑ සතුට එතුමන්ට පෙන්වා දුන් අල්ලාහ් ජනතාවගේ මාර්ගෝපදේශකයා වන මෙන් එතුමන්ට අ[illegible] කළේය. පුරා තුන් [illegible]රක් තිස්සේ එතුමෝ මිනිසුන් ඉස්ලාම අ[illegible]කමෙහි රහ[illegible]ද වූවෝය. මේ වසර තුන අවසාන[illegible] අ[illegible] තම[illegible] දූ[illegible]හෙව[illegible] ව[illegible]ට හැඟැදිලි කරදෙන මෙන් එතුමන්ට අණවූවේය.

ඉද්ධවූ නබිතුමා[illegible] කඳු[illegible] මතට න[illegible]ගෝය. එතුමන්



එහි සිට ජනතාවට හඬ ගසද්දී ඔවුහු එතුමන් හඳුනා ගත්හ. ඔවුහු එතුමන් වෙත දුවවිත් එතුමන් වටා රොක්වන්නට වූහ. ජනතාව අමතා ඔවුනට ශුභ ආරංචිය පවසන්නට එතුමන්ට අවශ්‍ය විය.

''මිනිසුනි!'', එතුමෝ හඬ නගා කතා කළෝය.

''මම අල්ලාහ් ගේ නබිවරයා වෙමි. මම ඔබ සැමගේ මඟ පෙන්වන්නා වෙමි. මම අතරමංවූ වන්ට මඟ කියා දෙන්නා වෙමි. මා ළඟ ඔබ සැම වෙනුවෙන් රමණීය තිළිණ වෙයි.''

''අල්ලාහ් දුන් පණිවුඩය මම ඔබ වෙත ගෙන ආවෙමි. එකම දෙවියන් කෙරෙහි විශ්වාසය තබන්න. එයින් සැබෑ හා සදාකාලික සතුට උදාකර ගන්න.

''ලා ඉලාහ ඉල්ලල්ලාහ්'' එනම් අල්ලාහ් හැරෙන්නට වෙනත් දෙවි කෙනෙක් නොවෙයි. මෙසේ පවසමින් ඔබ ඔබව පහත් බවින් හා වැරදි විශ්වාස වලින් මුදවා ගන්න.

**ශුද්ධවූ නබිතුමාණෝ ආශ්චර්යජනක තිළිණ අප වෙත ගෙන ආවෝය.**

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. ශුද්ධවූ නබිතුමාණෝ උපන්නේ කොහිද?
2. අල්ලාහ් නබිත්වයට එතුමන් තෝරාගනිද්දී එතුමන්ගේ වයස කොපමණ විද?
3. ශුද්ධවූ නබිතුමාණෝ සිය දූත මෙහෙවර පැහැදිලි කර දුන්නේ කෙසේද?
4. එතුමෝ මිනිසුන්ට කුමක් පැවසුවෝද?
5. කුමක් පවසන්නැයි එතුමෝ මිනිසුන්ගෙන් ඉල්ලා සිටියෝද?

**මේ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1............................හඳුනාගත් ඔවුහු එතුමන් කරා දුව ආවෝය.

2. මම අතරමං වූවන්ට....................................වෙමි. යයි ශුද්ධවූ නබිතුමාණෝ මිනිසුන්ට කීවෝය

3................................දුන්...................... මම ඔබ වෙත ගෙන ආවෙමි.

4. ''මිනිසුනි,''.................................''යයි පවසමින් ඔබ ඔබව පහත් බවින් මුදවා ගන්න.

5. ශුද්ධවූ නබිතුමාණෝ ....................... අප වෙත ගෙන ආවෝය.

## දෙලොස්වැනි පාඩම

# ආගම යනු කුමක්ද?

දයාබරවූත්, සානුකම්පිත වූත් අල්ලාහ් විසින් අපේ සතුට උදෙසා අවවාද දෙනු ලැබ ඇත. ඔහුගේ මඟ පෙන්වීම හා උපදෙස් අප කරා ගෙන එන ලද්දේ නබිවරුන් විසින්ය.
නබිවරුන් අල්ලාහ් පිළිබඳ අවබෝධය කෙරෙහිත්, යහපත්ම ජීවන ක්‍රමය කෙරෙහිත් අපට මඟ පෙන්වාදී ඇත.

අපගේ යහළුවන් සමඟ හැසිරෙන හැටිත්
අපගේ දෙමාපියන්ට ගරු කරන හැටිත්
අපගේ ගුරුවරයාට තුති පුදන හැටිත්

නබිවරුන් අපට කියාදී ඇත.

දයාබරවූත්, කරුණාවන්තවූත් අල්ලාහ් කෙරෙහි යොමුවන හැටිත්

අල්ලාහ් අප පිළිබඳව සතුටු කරවනු වස් යෙදිය යුතු ක්‍රියා මොනවාද යන්නත්

මීළඟ ලෝකයේ අපගේ අනාගතය සඳහා අපට අවශ්‍ය වන දෑ මොනවාද යන්නත් නබිවරුන් අපට කියාදී ඇත.

නබිවරුන් විසින් අප කෙරෙහි ගෙන එනු ලැබ ඇති උපදෙස් සහ වැඩ පිළිවෙලවල් 'ආගම'. යනුවෙන් හැඳින්වේ.

### ආගමානුකූල අය කවුද?

දෙවියන් කෙරෙහිත් මීළඟ ලෝකය කෙරෙහිත් විශ්වාස කරමින් නබිතුමාණන්ගේ උපදෙස් අනුගමනය කරන අයෙක් ආගමානුකූල මිනිසෙක් වෙයි.

**ප්‍රශ්න**

1. අල්ලාහ් ගේ උපදෙස් හා මඟ පෙන්වීම අවශ්‍ය වන්නේ කුමක් සඳහාද?
2. මේ උපදෙස් හා මඟ පෙන්වීම් අප වෙත ගෙන එන ලද්දේ කවුද උදවිය විසින්ද?
3. නබිවරුන් විසින් අපට කියනු ලැබ ඇති දෑ මොනවාද?
4. ආගම යනු කුමක්ද?
5. අප ''ආගමානුකූල'' අය වශයෙන් හඳුන්වන්නේ කාවද?
6. ආගමානුකූල මිනිස්සු මෙලොවත් මීළඟ ලෝකයේදීත් කෙසේ ජීවත් වන්නෝද?
7. අල්ලාහ් ආගමානුකූල මිනිසුන්ට සළකන්නේ කෙසේද?

## දහතුන් වැනි පාඩම

# ශ්‍රේෂ්ඨ නබිවරු

අල්ලාහ් විසින් මිනිසුන්ට මඟ පෙන්වනු සඳහා නබිවරුන් කිහිප දෙනෙක් එවනු ලැබ ඇත. ඔවුන් අතුරින් ශ්‍රේෂ්ඨතමයන් වන්නේ මේ පස්දෙනාය.

නූහ් අලෛයිහිස් - සලාම නබිතුමා

ඉබ්‍රාහිම් අලෛහිස්- සලාම් නබිතුමා

මූසා අලෛයි හිස්- සලාම නබිතුමා

ඊසා අලෛයිහිස් - සලාම නබිතුමා

මුහම්මද් සල්ලල්ලාහු අලෛයි හි වසල්ලම් නබිතුමා

මූසා ( අලෛයි) ගේ අනුගාමිකයෝ යුදෙව්වෝ නම් වෙති.

ඊසා ( අලෛයි) ගේ අනුගාමිකයෝ ක්‍රිස්තියානි අය වෙති.

මුහම්මද් (සල්) තුමාගේ අනුගාමිකයෝ මුස්ලිම්වරුන් වෙති.

සියළුම නබිවරුන් අල්ලාහ් විසින් එවන ලද අතර අපි ඒ සියල්ලන්ටම ගරු කරමු. සියලුම නබිවරුන් අතරින් ශ්‍රේෂ්ඨතමයා මෙන්ම යහපත්ම පුද්ගලයාත් වන්නේ ශුද්ධවූ මුහම්මද් නබිතුමාය. ශුද්ධවූ මුහම්මද් නබිතුමාණෝ අවසාන නබිවරයාණන් වන අතර එතුමාගෙන් පසු වෙනත් නබිවරයෙක් නොවේ.

''අලෛයි හිස් සලාම්'' යන්නෙහි අදහස ''එතුමන්ට සාමය අත්වේවා!'' යන්නයි. ශුද්ධවූ නබිවරුන්ගේ නම අගට අපි මෙ යෙදුම එකතු කරමු.

''සල්ලල්ලාහු අලෙයිහිවසල්ලම් ''යන්නෙහි අදහස ''අල්ලාහ් එතුමන්ටත් එතුමන්ගේ නිවසටත් ආශිර්වාද කරත්වා! යන්නයි. ශුද්ධවූ මුහම්මද් නබිතුමාණන්ගේ නම අගට අපි මේ යෙදුම එකතු කරමු. සමහර විට අපි ඒ වෙනුවට ( සල්) යනුවෙන් ලියමු.

ප්‍රශ්ණ

1. ශ්‍රේෂ්ඨතම නබිවරුන් කී දෙනෙක් විද? ඔවුන්ගේ නම් මොනවාද?
2. යුදෙව්වන් නම් කවුරුද?
3. ක්‍රිස්තියානි උදවිය නම් කවුරුද?
4. ශුද්ධවූ මුහම්මද් නබි-( සල්) තුමාගේඅනුගාමිකයන් හඳුන්වනු ලබන්නේ කෙසේද?
5. නබිවරුන් අතුරින් අවසානතමයාගේ නම කුමක්ද?
6. නබිවරුන් අතරින් ශ්‍රේෂ්ඨතමයා සහ වඩාත්ම උත්තමයා කවුද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. සියළුම නබිවරුන් එවන ලද්දේ ......................... විසින් වන නිසා අපි . ......................... ගෞරව කරමු.

2. සියළුම නබිවරුන් අතුරින් ශුද්ධවූ මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්.............වන අතර එතුමන්ගෙන් පසු........ නැත.

## දහ හතරවැනි පාඩම

# මුහම්මද් නබි( සල්)තුමාණන්ගේ ළමා කාළය.

ශුද්ධවූ මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහිවසල්ලම් මක්කාවේ පවුලක උපත ලද්දෝය. එතුමන්ගේ පියා අබ්දුල්ලාහ් වූ අතර මව ආමිනා නම් වූවාය.

මුහම්මද් ගේ පියා ඔහු උපදින්නට පෙර මිය ගියේය. ඔහු උපන් අළුත ඔහුගේ මව විසින් ඔහුව කිරි මවකට භාර කරන ලදි. මුහම්මද් තුමාගේ කිරි මවගේ නම හලීමා විය. හලීමා මුහම්මද්ව පිරිසිදු වානාශ්‍රය ඇති තැනෙක හදන වඩන අදහසින් කඳුකරයට ගෙන ගියාය.

මුහම්මද් හතර හැවිරිදි වියේ සිටියදී දිනෙක එඬේරුන් සමඟ කඳුවැටි ප්‍රදේශයකට යන්නට ඔහුට ඕනෑ විය. එඬේරුන් තම බැටළුවන් තණ කැවීමට ගෙන යන ලද්දේ ඒ අසළ පිහිටි තණ බිමකටයි. හලීමා මුහම්මද් ගේ හිස පීරා, ඔහුට අළුත් ඇඳුම් අන්දවා ඔහුගේ කර වටා කොළ පාට පබලු වලින් කළ මාලයක් ද පැළැන්දුවාය.

''මේ මාළය කුමක්සඳහාද?'' මුහම්මද් ඇසීය.

'ඒ කඳුවැටි ප්‍රදේශයේදී ඇතිවිය හැකි අනතුරුවලින් ඔබ ගළවා ගැනීම සඳහායි.'. හලීමා කීවාය.

මුහම්මද් එය ගළවා ආපසු ඇය අතට දුන්නේය.

''සියළු අනතුරුවලින් මාගළවා ගන්නට කෙනෙක් සිටියි. නමුත් පබළු මාළයකට එය කල නොහැකියි.'.

''ඒ කවුරුද?'' හලීමා විමතියෙන් ඇසුවාය.

''ඔබව සියලු අනතුරුවලින් ගළවා ගන්නේ කවුරුද?''

''අල්ලාහ්''. මුහම්මද් පිළිතුරු දුන්නේය.

''ඔහු අපගේ මැවුම් කරුවාය''.

ප්‍රශ්ණ

1. ශුද්ධවූ නබිතුමාණන් ගේ පියාගේ නම කුමක්ද?

එතුමාණන්ගේ මව ගේ නම කුමක්ද?

2. කිරිමවගේ නම කුමක්ද? අපගේ නබිතුමාණන් දරුවෙකු වශයෙන් හැදුණේ වැඩුණේ කොහිද?

3. මුහම්මද් නබිතුමාණන් තම කර පැළඳවූ මාළය ගැළවූයේ ඇයි?

4. හලීමා එතුමාණන්ගෙන් කුමක් ඇසුවාද?

5. ඊට නබිතුමා දුන් පිළිතුර කුමක්ද?

## පහළොස්වැනි පාඩම

# ළමයින්ට කරුණාව දැක්වීම

ශුද්ධවූ මුහම්මද් නබිතුමාණෝ දරුවනට ඉතා කරුණාවන්තවූ අතර ඔවුන්ට බොහෝ ආදරය කළෝය. දිවක් එතුමෝ තම මුණුපුරන් වන හසන් සහ හුසෙයින් තම උකුල මත ට ගෙන ඔවුන් සිප ගනිමින් ආදරය දක්වමින් සිටියහ. එතැන පසුකරගෙන යන මිනිසෙක් නබිතුමාණන්ගේ ක්‍රියාව දැක බෙහෙවින් පුදුමයට පත්විය. ''මට දරුවෝ දහ දෙනෙක් ඉන්නවා.'' ඔහු නබිතුමාණන්ට කීවේය. ''නමුත් මා ඔවුන්ගෙන් එක් අයෙකුවත් සිප වැළඳගෙන නැහැ.''

රළු හදවතක් ඇති මේ මිනිසාගේ කතාව ඇසූ නබිතුමාණෝ දැඩි ලෙස කෝපයට පත්වූහ. ''මේ මිනිසා නම් ස්වර්ගය කරා යනු ඇතැයි මා සිතන්නේ නැහැ!'' එතුමාණෝ පැවසූහ.

අපගේ ශුද්ධවූ නබිතුමාණෝ දරුවන්ට ආදරය කළෝය. ඔවුන් කර මත තබාගෙන ඔබ මොබ යමින් විනෝද වන්නට එතුමෝ පුරුදුව සිටියහ. මෙවන් විටෙක දරුවෝද දැඩි සතුටට පත්ව සිනාසෙන්නට පටන් ගනිති. දරුවන්ගේ නිර්මල වූ සතුටෙන් සහ සිනාවෙන් නබිතුමාණන්ද ප්‍රමෝදයට පත්වෙන අතර එතුමාගේ මුහුණද සිනාබර වන්නේය.

ළමයින්ට ඔවුන් දුටු තැන ''සලාම්!'' යයි සුභ පතන අපේ ශුද්ධවූ නබිතුමාණෝ තම සගයින්ට මෙසේ පවසා ඇත.

''මම දරුවන්ට''සලාම්'' යනුවෙන් සුභ පතමි. ඔවුන්ට ගෞරව කරමි. මුස්ලිම්වරුන් මගේ හැසිරීම අනුගමනය කළ යුතු අතර ළමයින්ට නිරන්තරයෙන්ම උණුසුම් ලෙස ආදරය කළ යුතු වන්නෝය.''



ශුද්ධවූ මුහම්මද් නබිතුමාණෝ පිරිමි හා ගැහැණු දරුවන් ගැන මෙසේ පවසා ඇත.

''මුස්ලිම්වරුනි! පියවරුනි මව්වරුනි, මාගේ අනුගාමිකයෙනි, ළමයින් කෙරෙහි කරුණාවන්ත හා සානුකම්පිත වන්න. මන්ද ළමයින්ට කරුණාව නොදක්වන අයෙකුට මුස්ලිම්වරුන් අතර තැනක් නැත.

**අපේ ශුද්ධවූ මුහම්මද් නබිතුමාණෝ දරුවන්ට කරුණාවන්තවූ අතර ඔවුන්ගේ නිර්මල හා අහිංසක සිනහව දැක ප්‍රමෝදයට පත්වූහ.**

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. නබිතුමාගේ හැසිරීම දැක අර මිනිසා පුදුමයට පත්වූයේ ඇයි?
2. ඔහු කුමක් කීවේද?
3. මෙය ඇසූ නබිතුමාණෝ කුමක් පැවසුවෝද?
4. අපගේ ශුද්ධවූ නබිතුමාණෝ දරුවන් ගැන අපට කුමක් පවසා ඇත්ද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. මම දරුවන්ට....................මි; ඔවුන්ට ගෞරව කරමි.

2. මුස්ලිම්වරුන් මගේ මේ හැසිරීම..........කළයුතු අතර නිරන්තරයෙන්ම ළමයින්ට..................ලෙස ....කළ යුතු වෙති.

3. අපගේ ශුද්ධවූ නබිතුමාණෝ ඔවුන් තම ආශිර්වාද ලත් කර මත තබාගෙන................ට පුරුදුව සිටියහ.

4. දරුවන්ගේ නිර්මල සිනහව දකින ශුද්ධවූ නබිතුමාණෝ.........................පත්වන අතර එතුමන්ගේ මුහුණද......වෙයි.

5. ළමයින් කෙරෙහි.......වන්න. මන්ද.....ට කරුණාව නොදක්වන අයෙකුට..........අතර.......නැත.



## දහසයවැනි පාඩම

# යහපත් ජීවිතයකට හොඳම ආගම ඉස්ලාමයයි

ශුද්ධවූ මුහම්මද් නබිතුමාණෝ මිනිසුන්ට නිතර මෙසේ කීවෝය.

'' මම ඔබ වෙත මේ ලෝකයේදී මෙන්ම මිලඟ ලෝකය සඳහාත් යහපත්ම දැය ගෙනවිත් ඇත්තෙමි. එලෙසින්ම අල්ලාහ් ඉස්ලාමීය ලෝකය කරා ඔබ සැම කැඳවන මෙන් මට අණ කර ඇත.''

**ඉස්ලාම් යනු කුමක්ද?**

ශුද්ධවූ මුහම්මද් (සල්) නබිතුමාණෝ විසින් අල්ලාහ් වෙතින් ගෙනෙන ලද සියලුම උපදෙස් ''ඉස්ලාම් දහම'' නම්වේ. ඉස්ලාමය ලොව සියළු ආගම් අතුරින් යහපත් හා වඩාත්ම පරිපූර්ණ ආගම ද වනතේය.

**මුස්ලිම්වරයෙක් යනු කවරෙක්ද?**

මුහම්මද් නබිතුමාණන් විසින් අල්ලාහ් වෙතින් ගෙනෙන ලද සියළුම උපදෙස් පිළිපදින්නට වෙර දරන පුද්ගලයෙක් මුස්ලිම්වරයෙක් වෙයි.

**අපගේ ශුද්ධවූ පොතේ නම කුමක්ද?**

අපගේ ශුද්ධවූ පොත ''කුර්ආනය '' නම් වේ. ''කුර්ආනය'' යනු අල්ලාහ් විසින් අප වෙත එවන ලද ජීවන වැඩ පිළිවෙලකි.

මුස්ලිම්වරුන් වන අපි ''කුර්ආනයට'' ගෞරව දක්වමු. එයින් අදහස් කෙරෙන්නේ අප කුර්ආනයේ උපදෙස් පිළිපදින වගයි.

**කුර්ආනය අවසානතම දේව ග්‍රන්ථයයි.**

**ප්‍රශ්ණ**

1. ශුද්ධවූ මුහම්මද් (සල්) නබිතුමාණෝ මිනිසුනට කුමක් පැවසුවෝද?

2. මුහම්මද් (සල්) නබිතුමාණන්ට අල්ලාහ් විසින් දෙනු ලැබූ අණ කුමක්ද?

3. ඉස්ලාම් ආගම ලොව වෙසෙන මිනිසුන්ගෙන් සමහරෙකු සඳහා පමණක්ද?

4. ඉස්ලාම් ආගම යන්නෙන් හැඳින්වෙන්නේ කවර දෑද?

5. ඉස්ලාමය කවර ආකාරයක ආගමක්ද?

6. මුස්ලිම්වරයෙකු යනු කවරෙක්ද?

7. මුස්ලිම්වරුන්ගේ ශුද්ධවූ පොත කුමන නමකින් හැඳින්වේද?

8. අප කුර්ආනයට ගෞරව කරන්නේ කෙසේද?

**මෙ වාක්‍යය සම්පූර්ණ කරන්න**

1. ඉස්ලාම් ආගම.............. වෙසෙන සියළුම මිනිසුන් සඳහාය.

2. ශුද්ධවූ මුහම්මද් නබිතුමාණන් විසින් ගෙනෙන ලද අල්ලාහ්ගේ උපදෙස්......................නමවේ.

3. මුස්ලිම්වරයෙකු යනු තමන්ගේ සියලුම කටයුතු හා හැසිරීම් වලදී .............. පිළිපදින අයෙකි.

4. කුර්ආනය අපගේ.................. පොතය.

එය අපගේ ජිවන...... යි.

5. මුස්ලිම්වරුන් වන අප ...................... ගරු කරමු.

එහි උපදෙස්.............. වෙර දරන්නෙමු.

# දහහත් වැනි පාඩම

## දැවුණු මිදි උයන

මිදි උයනේ අයිතිකරුවෝ බිම වාඩිවී එකිනෙකා හා කතාකරමින් සිටියහ. ''හෙට උද ඇසනින්ම අපි උයනේ එල සියල්ල නෙලා ගනිමු. එයින් කිසිවක් දුප්පතුන්ට දිය යුතු නොවේ. ''යයි ඔවුහු කතා වූහ.

නමුත් ඔවුන් අතුරින් සෙස්සන්ට වඩා යහපත් තැනැත්තෙක් මෙසේ [illegible] විය. 'මිත්‍රවරුනි!, අල්ලාහ් ගේ උපදෙ[illegible] කරන්න [illegible] කොට[illegible] දුප්පතුන්[illegible]මු'.



අනෙක් අය එයින් කෝපයට පත්වූහ.'' ඔබ අපේ කතාවට මැදිහත් වන්නේ ඇයි? ඔවුහු ඇසුවෝය.

''මිදි උයනේත් එහි එල වලත් අයිතිකරුවෝ අපි වෙමු. අඝ දුප්පතුන්ට ඒවා දෙන්නේ කුමකටද?''

රාත්‍රිය උදාවුණි. දැඩි අඳුරක් පැතිරෙමින් තිබුණ අතර සියල්ලන්ම



පසුවුණේ නින්දේය. අල්ලාහ් ගේ අණින් අකුණු සහිත මහා කුණාටුවක් ඇතිවුණි. මිදි උයනේ පළතුරු සහ ගස් වැල් සියල්ල අකුණු පහරකට ලක්විය. මුළු මිදි උයනම දැවී අළුවී ගියේය.

පසුදිනට පහන් විය. මිදි උයනේ අයිතිකරුවෝ නින්දෙන් අවදිවූහ. ''ඉක්මන් කරන්න, පළතුරු නෙළන්නට යන්නට සූදානම් වන්න.'' ඔවුහු කීවෝය. නිශ්ශබ්ද වන්න. දුප්පතුන්ට අප කියන දෙය නෑසිය යුතුයි. ''

ඔවුහු සෙමින් අඩිය ඔසවා තබා මිදි උයන කරා ගමන් කළෝය. ඔවුන්ට එහිදී දකින්ට ලැබුණේ අදහා ගත නොහැකි දසුනකි.

''මොනවා!?'' ඔවුන්ගෙන් කෙනෙක් බිරාන්තවූ හඬින් කෑ ගැසුවේය. ''මෙ අපේ මිදි උයන නොවේ. අපට මහ වැරදිලා.'.



''ඇයි නැත්තේ?'. තවකෙක් කීවේය. ''මේ අපේ මිදි උයනමයි. නමුත් එය දැවී ගොසිනි.''

''මිත්‍රවරුනි.'' යහපත් මිනිසා කටහඬ අවදි කළේය. ''අල්ලාහ් අමතක නොකරන මෙන් මම ඔබෙන් ඉල්ලා සිටියෙමි. ඔහුගේ අණට කීකරුවන ලෙස මම ඔබට කීවෙමි. දුප්පතුන්ට උපකාර කරන්නැයි මම ඔබෙන් ඉල්ලුවෙමි. මේ ඔබ මෙලොවදී ලැබූ දඬුවමයි. මිළඟ ලොවේදී ඔබට මීට වඩා දරුණුවූත් වේදනාකාරීවූත් දණ්ඩනයකට යටත් වන්නට වේවි. දුප්පතුන්ට ආධාර නොකරන අය ලබන තිළිණය මෙයයි.''

**මිළඟ ලොවේදී ලැබෙන දඬුවම වඩාත් දරුණු හා වේදනාකාරී වන්නේය.**

කල්පනා කර බලා පිළිතුරු දෙන්න.

1. මිදි උයනේ අයිතිකරුවෝ එකිනෙකාට කුමක් කීවෝද?

2. ඔවුන්ගෙන් එක් අයෙක් සෙස්සන්ට කීවේ කුමක්ද?

3. මිදි උයන දැවුණේ ඇයි?

4. පසුදින උදැසනින් මිදි උයන අයිතිකරුවෝ කුමක් කතා බස් කළෝද?

5. මිදි උයන කරා ළඟාවූ පසු ඔවුහු කුමක් කීවෝද?

1. මෙම කතාව ඔබේ මිතුරන්ට කියා දෙන්න.

11 මෙම කතාවේ එන සමහර අවස්ථා චිත්‍රයට නඟන්න.

මේ වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. ඔවුන් අතුරින් වඩා යහපත් තැනැත්තෙක් මෙසේ කියන්නට විය. ''මිත්‍රවරුනි............අමතක කරන්න එපා. එයින් කොටසක්.............ට දෙමු.

2.''ඉක්මන් කරන්න. පළතුරු නෙළන්නට යන්න සූදානම් වන්න.'. ඔවුහු කීවෝය. ''නිශ්ශබ්ද වන්න දුප්පත් මිනිස්සුන්ට අප කියන දේ..............යුතුය.''

3. යහපත් මිනිසා සෙස්සන්ට මෙසේ කීවේය. ''මේ ඔබ මෙලොවදී ලැබූ දඬුවමයි. මීලඟ ලොවේදී ඔබට මීට වඩා .........සහ .......දණ්ඩනයකට යටත් වන්නට වේවි.

## දහ අටවැනි පාඩම

# ළමයින්ට ආදරය දැක්වීම

ඉමාම් අලි (රලි) දරුවන්ට , විශේෂයෙන්ම අනාථ දරුවන්ට බොහෝ කරුණාවන්ත විය. තමන් යෙදුණ ඕනෑම කටයුත්තක් නතර



කොට ළමයින්ට ''සලාම්'. කියා සුභ පතන්නටත් ඔවුන්ගේ කඳුලු පිසලන්නටත්, උරයෙන් අල්ලා ''මගේ පුතා, ඔබ හඬන්නේ ඇයි? කිසිවෙක් ඔබ රිදවූයේද? එන්න මම ඔබ ගෙදර කැඳවාගෙන

යන්නම්.'' යයි පවසන්නටත් පෙළඹෙයි.

අලි (රලි) දරුවන් ගෙදර කැඳවාගෙන ගොස් ඔවුනට පියෙකුටත් වඩා යහපත් ලෙස සළකන්නේය. දරුවන් වෙනුවෙන් රස කැවිලි, කේක් සහ පැණි ආදිය ගෙන එන මෙන් ද එතුමන් තමන් විසින්ම ඒවා දරුවන්ට කැවීම ද සිරිතක් කොට ගනී.

ඉමාම් අලී අනාථ දරුවන්ට, විශේෂයෙන්ම අල්ලාහ් ගේ මාර්ගයේ යමින් සටන් කොට මියගිය රණවිරුවන්ගේ අනාථ දරුවන්ට ආදරය කරන මෙන් ද, කරුණාවන්ත වන මෙන්ද මිනිසුන්ට නිතර පවසා ඇත. ''ඔවුන්ගේ සෙනෙහබර පියවරුන් ඔවුන්ට අහිමිවී ඇත. '' එතුමෝ පවසන්නෝය. ''ඒ නිසා ඔවුන් තුටු පහටු කරවා පියෙකු විලසින්ම



ඔවුන් රැක බලා ගන්න''.

'ඔවුන්ගේ පියවරුන් දිවිපුද ඇත්තේ ඉස්ලාමය වෙනුවෙන් සටන්

මෙහෙයවද්දීය. ඒ නිසා ඔබේ ආධාරය කෙරෙහි ඔවුනට අයිතිවාසිකම් ඇත. ඔවුන්ගේ දරුවන් තුටු පහටු කිරීමෙන් හා ඔවුන් රැක බලාගැනීමෙන් මේ රණවිරුවන්ගේ ආත්මයන් හී පැහැදීම ඔබ කෙරෙහි ලබා ගන්න.''

ඉමාම් අලීතුමා සෑම විටෙකම අනාථ දරුවන්ට, විශේෂයෙන්ම රණවිරුවන්ගේ අනාථ දරුවන්ට , සිය අවධානය දැක්වූයේය. නිතර ඔවුන් බලන්නට යන එතුමා, ඔවුන් හා එක්වී රසබස් දොඩන්නටත්, ඔවුන් හා ක්‍රීඩා කරන්නටත් අමතක කළේ නැත. ඔවුන්ගේ අධ්‍යාපනය හා පුහුණුවීම් පිළිබඳව වග බලා ගැනීම එතුමන් නොඅඩුව ඉටු කළෝය. මේ දරුවන් මුහුණ පෑ දුෂ්කරතා විසඳලන්නටත් දැඩි වෙහෙසක් දැරූ එතුමෝ සෑම විටෙකම ඔවුන්ට යහපත් අවවාද හා මාර්ගෝපදේශ ලබාදුන්හ. නොයෙක් නෑගි භෝග වලින් දුප්පත් දරුවන්ට සංග්‍රහ කිරීමත්, ඔවුන් කෙරෙහි ගරුත්වයෙන් යුතුව ඔවුන්ගේ වියදම්පියවීමත් එතුමාගේ තවත් සිරිතක් වූයේය.

ඉමාම් අලී( රලි) අනාථ දරුවන්ට කොතරම් කරුණාවන්ත වූයේද කිවහොත් තම දේශන වලදී ඔවුන් පිළිබඳව අවධාරණය කොට දැක්වූයේය. එතුමන්ගේ සගයෙකු වරක් මෙසේකියා තිබුණි. ''මාද අනාථ බාල දරුවෙක් වී නම් කොතරම් අගේ දැයි මට සිතේ. මන්ද එවිට ඉමාම් අලී ( රලි) ගෙන් අනාථ දරුවන් ලබන කරුණාව සහ ආදරය මට ද හිමි කර ගත හැකි නිසාය.''

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. ළමයින් ගැන , විශේෂයෙන්ම අනාථ දරුවන් ගැන ඉමාම් අලී ( රලි) තුමා ස්වකීය අනුගාමිකයන්ට නිතර පැවසුවේ මොනවාද?
2. ඉමාම් තුමා අනාථ දරුවන්ට දැක්වූ සැළකිල්ල ගැන එතුමන්ගේ සගයෝ කුමක් කීවෝද?
3. ඉමාම් අලී( රලි) අනාථ දරුවෙකු දුටුවිට හැසිරෙන්නේ කෙසේද?

**මේ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. ඉමාම් අලිතුමා..................ට බොහෝ කරුණාවන්ත වූහ.

2. ඉමාම් අලි තුමා ලමයින්ට................යයි සුභ පතමින් ආචාර කරයි.

3. අලි (රලි) දරුවන් කැඳවාගෙන ගොස් ඔවුන්ට .....................වඩා යහපත් ලෙස සළකන්නේය.

4. ඉමාම් අලිතුමා................ආදරය කරනමෙන්ද, කරුණාවන්ත වන මෙන් ද මිතිසුන්ට නිතර පවසා ඇත.

## දහනව වැනි පාඩම

# ඉමාම් හසන් (රලි) ගේ අමුත්තෝ

ඉමාම් හසන් (රලි) දුප්පතුන්ගේ මිතුරෙක් වූ අතර ඔවුන්ට බොහෝ කරුණාවන්ත වූයේය. දිනක් එතුමන් මගක් දිග යද්දී දුගී මිනිසුන් පිරිසක් බිම වාඩිවී ආහාර ගනිමින් සිටිනු දක්නට ලැබුණි. ඔවුන්ගේ ආහාරය වූයේ වේලී ගිය රොටි කැබැලි ය. එතුමන් දුටු ඔවුහු



මෙසේ ඇමතුවෝය.

''එන්න. අප සමග එක්වී ආහාර ගන්න. ඒ ගැන ලැජ්ජා වන්න එපා.!''

ඉමාම් හසන් තුමා තම අසු පිටින් බැස දුගී පිරිස සමඟ ආහාර ගනු වස් බිම වාඩි ගත්තේය.

''සහෝදරවරුනි!'', මද වේලාවකින් එතුමෝ කතා කරන්නට වූහ. ''මම ඔබේ ආරාධනය පිළිගත්තෙමි. දැන් මගේ නිවසට පැමිණ සංග්‍රහ විඳින මෙන් බැගෑපත්ව ඉල්ලමි.''

එතුමන්ගේ ආරාධනය පිළිගත් පිරිස ඉමාම් හසන් තුමා සමඟ එතුමන්ගේ නිවස කරා ගියෝය.

''ඉතා වැදගත් අමුත්තන් පිරිසක් මා සමඟ පැමිණ සිටිනවා. '' එතුමෝ සිය නිවසේ අයට කීවෝය. ''ඔවුන්ට හොඳම ආහාර වලින් සංග්‍රහ කරන්න.''

අමුත්තන් පිරිස එතුමන්ගේ නිවසට පිවිසි විට එතුමෝ දැඩි ගෞරවයකින් යුතුව ඔවුන්ට සංග්‍රහ කළහ. ඔවුහු බොහෝ සතුටට පත්වූහ.

ඉමාම් හසන් තුමා දුප්පතුන්ට බොහෝ කරුණාව දැක්වූයෙකි. ඔවුන්ට උපකාර කිරීම සිරිතක් කොට ගත් එතුමන් විසින් සිය ජීවිත කාළය තුළ කිහිපවරක්ම ස්වකීය වස්තුවෙන් හරි අඩක් පමණ දුප්පතුන්ට පිරිනමනු ලැබ ඇත.

ඉමාම් හසන් තුමා දුප්පතුන්ගේ මිතුරෙක් වූ අතර ඔවුන්ට බොහෝ කරුණාව දැක්වූයේය.

**ප්‍රශ්ණ**

1. ඉමාම් හසන් ගේ නිවසට පැමිණි අමුත්තෝ කවුද?
2. ඉමාම් හසන් තුමා ඔවුනට සංග්‍රහ කළේ කවර ආකාරයේ ආහාර වලින්ද?
3. දුප්පතුන් හා අසරණයන් ඉදිරියේ ඉමාම් හසන් තුමා හැසිරුණේ කෙසේද?
4. දුප්පතුන්හා අසරණයන් ඉදිරියේ ඔබ හැසිරෙන්නේ කෙසේද?

5. මේ පාඩමින් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද?

6. ඉමාම් හසන් තුමා අනුගමනය කරන්නේ කෙසේද?

7. දුප්පතුන්ගේ පැගුණ අයිතිවාසිකම් රැකදීම අපේ යුතුකම නොවේද?

8. අප ඔවුන්ගේ අයිතිවාසිකම් රැක දෙන්නේ කෙසේද?

**මේ වාක්‍යය සම්පූර්ණ කරන්න**

1. ඉමාම් හසන් තුමා දුප්පතුන්ට............විය.

2. ඉමාම් හසන් තුමා ...................පිටින් බැස, දුගී පිරිස සමඟ ආහාර ගනු වස් ...........වාඩි ගත්තේය.

3.‘‘................ක් මා සමඟ පැමිණ සිටිනවා. ඔවුන්ට හොඳම ............ වලින් සංග්‍රහ කරන්න..’’ එතුමෝ සිය නිවසේ අයට කීවෝය.

4. ඉමාම් හසන් තුමා ඔවුන්ට...................යුතුව සංග්‍රහ කළේය.

## විසි වැනි පාඩම

# සතුන්ට කරුණාවන්ත වීම

ඉමාම් හසන් (රලි) ආහාර ගනිමින් සිටියදී බල්ලෙක් එතැනට පැමිණ එතුමන් ඉදිරියේ බලාගත් වනම සිටියේය. ඉමාම් හසන් තුමා



එක් ආහාර කටක් අනුභව කොට තවත් ආහාර බිඳක් බල්ලා ඉදිරියට විසි කළේය. බල්ලා එය කා දමා, ස්තුති පූර්වකව වලිගය වනා බුරමින් ඉමාම් හසන් තුමා දෙස හිස ඔසවා බැලුවේය.

ඉමාම් හසන් තුමා තවත් ආහාර කටක් බල්ලා දෙසට විසි කළේය. එතැන පසුකරමින් ගිය මිනිසෙක් ඉදිරියට පැමිණ මෙසේ කියන්නට විය.

''ඔබතුමාට නිදහසේ ආහාර ගන්නට නොදී ඔබතුමන් ඉදිරියේ මේ බල්ලා සිට ගෙන සිටීම වරදකි. මට උඟ එලවා දමන්නට අවසර දෙන්න.''

''එපා එසේ කරන්න එපා.''

ඉමාම් හසන් තුමා ඔහුට කීවේය.

''මේ සතා අල්ලාහ් විසින් මවන ලද්දෙකු වන අතර අල්ලාහ් උඟට ආදරය කරන්නේය. උඟ කුස ගින්නෙන් පෙළෙයි. අල්ලාහ් ගේ ආහාර හා ආශිර්වාද තනිව විඳිමින් ඔහුගේ මැවුමක් වන මේ සතාට එයින් කොටසක් නොදී සිටීම වරදකි. ඒ කෙසේ වෙතත් උඟ බඩගින්නෙන් මා දෙස බලා සිටිනවා ඔබට නොපෙනේද?

**ප්‍රශ්ණ**

1. ඉමාම් හසන් (රලි) බල්ලාට ආහාර දුන්නේ කෙසේද?
2. ඔබ කිසියම් විටෙක සතුන්ට ආහාර දී තිබේද?
3. ඒ බල්ලා ස්තුතිය ප්‍රකාශ කළේ කෙසේද?.
4. අර මිනිසාට බල්ලා එලවා දමන්නට උවමනා වූයේ ඇයි?

## විසිඑක් වෙනි පාඩම



# යහපත් ක්‍රියාවන් හී යෙදෙන දරුවා

අහමද් බෙහෙවින් යහපත් පිරිමි දරුවෙකි. ඔහු කිසිවෙකුට කරදර නොකරයි. තමන්ගේ සහෝදර වරුන්ට සහ සහෝදරියන්ට මිතුරෙකු වන ඔහු ඔවුන්ට ඉතා කරුණාවන්තය. පළමු වසරේ සිටින තම සොහොයුරිය මාහින්ට ඇගේ පාඩම් හොඳින් ඉගෙනගැනීමට ද ඔහු උපකාර කරයි. විවේක වේලාවේදී ඔහු තම පංතියේ මිතුරන්ට පාඩම් වලට සූදානම් වන්නට උදව් කරයි.

අහමද් සෑම ළමයෙකුටම කරුණාවන්තය. මෘදුය. ඔහුගේ හැඟීම නම් සියලුම දරුවන් ඔවුන්ගේ පාඩම් හොඳින් ඉගෙන ගත යුතුය යන්නයි.

තමන්ගේ මිතුරන් අතරින් අයෙකුට පෑනක් හෝ කඩදාසි ඕනෑවූ විට අහමද් ඔහුට ඒවා ලබා දෙන්නේ දැඩි කැමැත්තෙනි.

අහමද් යහපත් ක්‍රියාවන්හී යෙදෙන කරුණාවන්ත දරුවෙකු වන නිසා, සෑම කෙනෙක්ම ඔහුට කැමතිය. සියලු දෙනාම ඔහු අගය කරයි; ඔහුට ගෞරවය දක්වයි.

ඒ සියල්ලන්ටම වඩා අල්ලාහ් ද ඔහුට ආදරය කරන අතර අල්ලාහ් ගෙන් ඔහුට රමණීය තිළිණයක් ලැබෙනු ඇත. අල්ලාහ් යහපත් ක්‍රියා

සිදු කරන අයට ආදරේය

අල්ලාහ් කුර්ආනය තුළින් අපට මෙසේ පවසයි.

යහපත් ක්‍රියා සිදු කරන අයට අල්ලාහ් ආදරය කරයි.

**ප්‍රශ්ණ**

1. සෑම කෙනෙක්ම අහමද් ප්‍රිය කරන්නේ කුමක් නිසාද?
2. අල්ලාහ් අහමද් ට ආදරේද?
3. අල්ලාහ් යමෙකුට ආදරේ නම් ඔහු කුමක් කරයිද?
4. මිනිසුන් අපට ප්‍රිය කරන්නට නම් අපි කුමක් කළ යුතු වෙමුද?
5. යහපත් ක්‍රියා සිදු කරන අය ගැන අල්ලාහ් කුර්ආනයේ කුමක් පවසන්නේද?
6. ඔබ ඔබේ මවටත්, පියාටත් උපකාර වන්නේ කෙසේද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. අහමද් තමාගේ සෙහොයුරියට ................වන අතර ඇයට ............................ය.

2. ඔහු තම සෙහොයුරියට ඇගේ පාඩම් හොඳින් ඉගෙන ගැනීමට .......................කරයි.

3. අහමද් ..................................... සිදු කරන ..................දරුවෙකු නිසා සියල්ලෝම ඔහුට ........................ 4. ඒ සියල්ලට වඩා අල්ලාහ් ඔහුට ....................කරන අතර අල්ලාහ්ගෙන් ඔහුට ......................... ලැබෙනු ඇත.

5. අල්ලාහ් කුර්ආනය තුළින් අපට මෙසේ පවසයි ;

........................... ...................................

## විසිදෙවැනි පාඩම

# කිසිවෙකුට කරදර නොකරන දරුවා

හමීද් ඉතාමත්ම යහපත් පිරිමි දරුවෙකි. ඔහු කිසිවෙකුට කරදර කරන්නේ නැත. ඔහු තම පාසැලේ සිටින කිසිම ශිෂ්‍යයෙකු තරහ ගන්වන්නේද නැත; මිනිසුන්ගේ ගෙවල්වල දෙර-ජනෙල් වලට ගල් ගැසීම වැනි අයහපත් වැඩ කරන්නේද නැත. දෙරවල් හා බිත්ති මත චිත්‍ර ඇඳීම සහ ලිවීමද අයහපත් වැඩක් බව ඔහු දනියි.

එමෙන්ම මිනිසුන්ට කරදර කිරීම අයහපත් හා පව්කාර ක්‍රියාවක්



බව හමීද් දනියි. යමෙකු දුකට පත් කිරීම පවක් බවත්, එයට වන්දි ගෙවන තුරුද, දුකට පත් නැනැත්තාට සහනයක් ලැබෙන තුරුද අල්ලාහ් ගෙන් සමාවක් නොලැබෙන බවත් ඔහු වටහාගෙන ඇත.

හමීද් ක්‍රීඩාවෙහි යෙදෙද්දී පවා අසල්වැසියන්ට කරදර නොකරන්නටත්, අධික ලෙස ඝෝෂා කරමින් ඔවුන් අසතුටට පත්

නොකරන්නටත් , ඔවුන් විවේක ගන්නා හෝ නිද ගන්නා අවස්ථාවල ඊට අවහිර නොකරන්නටත් හමීද් පරෙස්සම් වෙයි. තමන්ගේ අසල්වැසියන්ට කරදර කරන්නන්ව අල්ලාහ් ප්‍රිය නොකරන බව ඔහු හොඳින් දනියි.

හමීද් අනුන්ට කිසිදු ආකාරයකින් කරදර නොකරන බුද්ධිමත් දරුවකු නිසා සෑම කෙනෙක්ම ඔහුට ආදරය කරයි. එලෙසින්ම අල්ලාහ්ද ඔහුට ආදරය කරන්නේය.

ශුද්ධවූ නබි (සල්) තුමාණන් මෙසේ පවසා ඇත.

තමන්ගේ අසල්වැසියන්ට කරදර කරන තැනැත්තෙකුට ස්වර්ගයට යා නොහැක.

**ප්‍රශ්න සහ අභ්‍යාස**

1. මුහම්මද් නබි (සල්) තුමාණෝ අසල්වැසියන් ගැන අපට කියාදී ඇත්තේ මොනවාද?
2. ක්‍රීඩාවෙහි යෙදෙද්දී අසල්වැසියන්ට කරදර නොවෙන පරිදි හැසිරීමට හමීද් වග බලා ගත්තේ කෙසේද?
3. හමීද් වැළකී සිටින්නේ කවර දේවලින්ද?
4. අල්ලාහ් හමීද්ට ආදරය කරන්නේ ඇයි?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න**

1. මිනිසුන්ට කරදර කිරීම ............ හා ............ ක්‍රියාවක් බව හමීද් දනියි.
2. යමෙකු ..................... පවක් බවත් හමීද් දන්නේය.
3. එයට වන්දි ගෙවන තුරුද, දුකට පත් තැනැත්තාට .................... ලැබෙන තුරුද අල්ලාහ්ගෙන් ...................... නොලැබේ.
4. හමීද් අනුන්ට ................... නොකරන .............. දරුවකු නිසා අල්ලාහ් ඔහුට ආදරය කරයි.

## විසිතුන් වැනි පාඩම

# පිරිසිදුව සිටිමු

වරෙක අපේ ශුද්ධවූ මුහම්මද් නබි ( සල් ) තුමාණන් විසින් මුහුණ පුරා දූවිලි හා වැලි පැතිරුණ මිනිසෙක් දක්නා ලදී. ඔහුගේ හිසකෙස් කිළුටුවී ගැට ගැසී තිබුණි. ඔහුගේ මුව අපවිත්‍ර දුගඳින් යුක්ත විය; මුහුණ හා දැත් සැහෙන කලක් සෝද නොතිබුණි. ඔහු ඇඳ සිටි ඇඳුමද උකුණන්ගෙන් පිරී තිබුණ අපවිත්‍ර එකකි.

ශුද්ධවූ නබි තුමාණෝ ඔහුගේ දර්ශණයෙන් අසතුටට පත්වූ අතර ඔහුට මෙසේ කීවේය. ''ඔබ මෙසේ ජීවත් වන්නේ ඇයි? පිරිසිදුකම ආගමේ එක් මුහුණුවරක් බව ඔබ නොදන්නෙහිද? අල්ලාහ් පිරිසිදුව සිටින අයට ආදරය කරන බව ඔබ අසා නැතිද? මුස්ලිම්වරයෙකු



පිරිසිදුව සිටීමෙන් අල්ලාහ්ගේ ආශිර්වාදය ප්‍රයෝජනයට ගැනීමට දත යුතුය.

"ඕනෑ තරම් වතුර ඇති නිසා ඔබේ සිරුර සෝදගෙන පිරිසිදුව පිළිවෙළකට සිටින්න," යයිද නබි (සල්) තුමාණෝ ඔහුට අවවාද කළෝය.

**පිරිසිදුකම ආගමේ එක් මුහුණුවරකි. මුස්ලිමුන් සෑම විටෙකම පිරිසිදුව සිටිය යුතුය.**

ප්‍රශ්න සහ අභ්‍යාස

1. ඔබේ දෑත් දෙස බලන්න, ඒවා හොඳින් පිරිසිදු කරගෙන ඇතිද?
2. ඔබේ දෑතේ නියපොතුවල ස්වභාවය පරීක්ෂා කරන්න.
3. කැඩපතකින් ඔබේ දත් දෙස බලන්න. ඒවා පිරිසිදුද?
4. ඔබ ඔබේ දත් පවිත්‍ර කරගන්නේද?. දවසකට කී වරක්ද? කුමනවේලාවලදීද?
5. ඔබේ සිරුරත්, ඇඳුමත් පිරිසිදුව තබාගන්නට ඔබ පරෙස්සම් වන්නේද?

**මේ වාක්‍යය සම්පූර්ණ කරන්න**

1. "ඔබ මේ තරම්................හා නොසැළකිලිමත්ව ජිවත් වන්නේ ඇයි?

"පිරිසිදු කම ආගමේ එක්............බව ඔබ නොදන්නෙහිද?

3. මුස්ලිම්වරයෙකු සෑම විටම..................................සිටිය යුතුය.
4. අල්ලාහ්..............................අයට ආදරය කරන බව ඔබ නොදන්නෙහිද?

5. අවශ්‍ය තරම් වතුර ඇති නිසා ඔබේ සිරුර..............පිළිවෙළකට සිටින්න.

මෙ පිරිමි දරුවා අපිරිසිදුය. නොසැළකිලිමත්ය. ඔහු ඔහුගේ දැත් සහ මුහුණ සෝදගෙන නැත. ඔහුගේ ඇඳුම් අපිරිසිදුය. වැරහැලි වී ගොසිනි. මෙ හේතු නිසා, කිසිවෙක් ඔහු ප්‍රිය කරන්නේ නැත.

කරිම ඉතා පිරිසිදු පිරිමි දරුවෙකි

ඔහු තමාගේ දැත් සහ මුහුණ සබන් හා වතුර යොද සෝද ගනියි.

ඔහු තමන්ගේ ඇඳුම පිරිසිදුව තබාගනියි.

මෙ හේතු නිසා හැම කෙනෙක්ම ඔහු ප්‍රිය කරයි.

අල්ලාහ් පිරිසිදුව සිටින මිනිසුන්ට ආදරය කරයි.




## විසිහතර වැනි පාඩම

# අපි සලාතය ඉටු කරමු

අපි සලාතය ඉටු කරමු; සලාතයේදී අපේ කරුණාවන්තවූත්, දයාබරවූත් අල්ලාහ් හා සමඟ කතා කරමු. සලාතය වනාහි ආගමේ එක් කුළුණකි. නබි (සල්) තුමාණෝ අපට ඒ ගැන මෙසේ පවසන්නෝය.

"සලාතය අඩු තක්සේරුවකින් ගෙන එය නොසළකා හරින කවරෙක් වුව මගේ අනුගාමිකයන්ගෙන් අයෙක් නොවෙයි."



ඉස්ලාමය තම දරුවන්ට සලාතය පිළිබඳව උගන්වන මෙන්ද, හත් හැවිරිදි වයසේ පටන් ඔවුන්ට සලාතය ඉටු කිරීමේ පුරුද්ද පුහුණු කරවන මෙන්ද, නොකඩවා ඔවුන්ට සලාතය ඉටු කරන්නට මතක්

කරවන මෙන්ද, ඔවුන් සලාතයට කැඳවා ගන්නා මෙන්ද දෙමාපියන්ට උපදෙස් දෙයි.

වැඩිහිටි වයසට පත් ගැහැණු දරුවන්ට හා පිරිමි දරුවන්ට තමන් විසින්ම සලාතය ඉටු කිරීම අනිවාර්ය වන අතර, ඔවුන් සලාතය ඉටු කරන්නේ නැතිනම් අකීකරු බවට පත්වෙන අතර අපරාධකරුවන් හා සම වන්නේය.

**සලාතයෙහි යෙදෙන දරුවන්ට දෙවියන් ආදරේය; ඔවුන්ට දෙවියන්ගෙන් රමණීය තිළිණ ලැබෙයි**

**ප්‍රශ්ණ**

1. සලාතයේදී අප කතා කරනුයේ කා සමඟද?
2. අපේ නබි ( සල්) තුමාණන් සලාතය අඩු තක්සේරුවකින් ගන්නා මිනිසුන් ගැන කුමක් පවසා ඇත්ද?
3. තමන්ගේ හත් හැවිරිදි දරුවන් වෙනුවෙන් දෙමාපියන් විසින් ඉටු කරනු ලැබිය යුතු යුතුකම කුමක්ද?
4. ඔබට සලාතය ඉටු කරන අයුරු උගන්වන්නේ කවරෙක්ද?

''සලාතය ආගමෙ කුළුණක්ය'' යන්නේ තේරුම කුමක්ද?

### විසිපස් වැනි පාඩම

# වු(ද්) ලූ දෝවනය

සලාතය ඉටු කරන්නට අවශ්‍ය අයෙක් මුලින්ම වු( ද්) ලූ දෝවනය කරගත යුතුය. වු( ද්) ලූ යනු පහත දැක්වෙන අනු පිළිවෙළට ඉටු කළ යුතු ආගමික දෝවනයකි.

1. සලාතය ඉටු කිරීම සඳහා වු( ද්) ලූ දෝවනය ගනු ලබන්නේය යන පවිත්‍ර සිතැඟි ඇති කර ගනිමු.

2. අපේ හිසකෙස් වල සීමාවේ සිට නිකටයේ යටි පැත්ත දක්වා මුව දෝවනය කර ගනිමු.

3. අපේ දකුණු අතේ ඇඟිලිවල කෙළවර සිට වැලමිට දක්වා දෝවනය කර ගනිමු.



. අපේ වම් අතේ ඇඟිලිවල කෙළවර සිට වැලමිට දක්වා දෝවනය කර ගනිමු.

. අපේ හිස ''මස්හු'' කර ගනිමු.

. දකුණු පයේ මුදුන හරහා ඇඟිළි කෙළවරේ සිට දෙවළළුකර







ගන්නා තැන තෙක් දෝවනය කර ගනිමු.

. වම් පයේ මුදුන හරහා ඇඟිලි කෙළවරේ සිට වළළුකර පටන් ගන්නා තැන තෙක් දෝවනය කර ගනිමු.

ඔබේ පියා, මව හෝ ගුරුවරයා ඉදිරියේ වු(ද්)ලූ දෝවනය ඉටු කරමින් එය නිවැරදි ලෙස ඉටු කරන ලද්දේ දැයි ඔවුන්ගෙන් අසා දැන ගන්න.

විසිහය වැනි පාඩම

# ආහාර ගැනීමේ සිරිත්

ඉස්ලාම් ආගම අති උතුම් ආචාරධර්ම සහ දිනපතා අනුගමනය කළ යුතු සිරිත් අපට කියාදෙන අතර යහපත්ම ආකාරයෙන් ජිවත් වීම සඳහා අපට අවශ්‍ය වැඩ සටහන්ද ගැබ් කොට ඇත. වැඩසටහන් ක්‍රියාවට නැඟීමට අපට හැකිනම් අප සතුටින් හා පිරිපුන් බවින් සදකල්හිම ජිවත්වනු ඇත. ඉස්ලාමය අපට කෑම බීම ගත යුතු හොඳම පිළිවෙළද විස්තර කර දෙන්නේය.



## ආහාර ගැනීමෙදී අනුගමනය කළ යුතු සිරිත්

1. ආහාර ගැනීමට පෙර ඔබේ දෑත් පිරිසිදු වතුරින් සෝද ගන්න. මන්ද, ඔබේ දෑත් අපවිත්‍ර වී තිබෙන්නටත්, ඒවායෙහි විෂබීජ රුඳී

තිබෙන්නටත් හැකි නිසාය. විෂබීජ ඔබේ ශරීරයට ඇතුළු වුණ තැන ඔබ රෝගී බවට පත් වන්නෙහිය.

2. ඔබේ ආහාරය අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමින් ''බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්'' යයි පවසන්න.

3. ආහාර ගැනීමේදී ස්වල්පය බැගින් මුඛය තුළට ගන්න; ආහාරය මෘදු බවට පත්වනතෙක් විකන්න. මන්ද වඩා මෘදු ආහාර වඩා පහසුවෙන් දිරවන නිසාය. මෙය ශරීර සෞඛ්‍යය සඳහා යහපත්ය.

4. සෑම විටම ඔබ ඉදිරියේ ඇති ආහාරම අනුභව කරන්න. අනෙකකු ඉදිරියේ ඇති ආහාර ගැනීමට අත දිගු නොකරන්න.

5. කුස පිරුණ තැන ආහාර ගැනීම නතර කරන්න. පමණට වඩා කුස පුරවා ගැනීම අහිතකරය.

6. ආහාර අනුභව කිරීමෙන් පසු අල්ලාහ්ට කළගුණ සළකනු පිණිස ''අල්හම්දු- ලිල්ලාහි රබ්බිල් ආලමීන්'' (විශ්වයේ සමිදුණන් වන අල්ලාහ්ට ප්‍රශංසාව හිමිවේවා!) යයි පවසන්න.

7. කුසගින්නෙන් පෙළෙන දුගී අය ගැන සිතා ඔවුන්ට උපකාර කරමු.

**අල්ලාහ් ගේ නාමයෙන් ආහාර ගැනීම අරඹන අපි ආහාරය අහවර කිරීමෙන් පසු අල්ලාහ් ට තුති පුදමු.**

**ප්‍රශ්ණ සහ අභ්‍යාස**

1. ආහාර ගැනීමට පෙර අප කුමක් කළ යුතු වෙමුද?
2. අප ආහාර ගැනීම අරඹන්නේ කාගේ නාමයෙන්ද? ඇයි?
3. අප ආහාර ගන්නේ ස්වල්පය බැගින්ද? ඇයි?
4. ආහාර ගැනීමෙන් පසු අප ස්තුති කරන්නේ කාටද?

**මේ වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. ඉස්ලාමය අපට උතුම්ම.......................කියා දෙයි.
2. අපට මේ සියළු වැඩ සටහන් ක්‍රියාවට නැගීමට හැකිනම් අප .........................සඳ කල්හිම ජීවත් වනු ඇත.
3. ඉස්ලාමය අපට .................................විස්තර කර දී ඇත.
4. ඔබේ කුස ......................පිරෙන්නට කලින් ආහාර ගැනීම නතර කරන්න.
5. ආහාර අනුභව කිරීමෙන් පසු අල්ලාහ් ට කළගුණ සැළකීම පිණිස''................................................'' යයි පවසන්න.

### විසිහත්වැනි පාඩම

## ගුරුවරුන් සතු ගරුත්වය

අපේ මුහම්මද් (සල්) නබිතුමාණෝ අපට මෙසේ පවසති.' මම මිනිසුන්ගේ ගුරුවරයා වෙමි. මම ඔවුනට ආගමික පාඩම් කියා දෙන්නෙමි.''

ඉමාම් අලි (රලි) අපට මෙසේ කියන්නේය.''ඔබේ පියාටත් ඔබේ ගුරුවරයාටත් ගෞරව කිරීම පිණිස ඔබ වාඩිවී සිටින තැනින් නැඟී සිටින්න.''

සිවුවැනි ඉමාම්වරයා වන ඉමාම් සෙයින් අල් ආබිදීන්(රලි) අපට කියන්නේ මෙසේය.

''ගුරුවරයෙකු සතුව තමාගේ ශිෂ්‍යයා කෙරෙහි යම් යම් අයිතිවාසිකම් ඇත.


පළමුවැන්නඃ ශිෂ්‍යයන් විසින් ඔවුන්ගෙන් ගුරුවරයාට ද ැඩි ගෞරවයකින් යුතුව සළකනු ලැබිය යුතු බව.

දෙවැන්නඃ ඔවුන් ඔහු කියන දෙයට උනන්දුවෙන් සවන් දිය යුතු බව

තුන්වැන්න : ඔවුන් නිරන්තරයෙන්ම ඔහුට මුහුණ පා සිටිය යුතු බව

සිවුවැන්න : ඔවුන්ගේ බුද්ධිය මුළුමනින්ම පාඩම ඉගෙනගැනීම කෙරෙහි යොමුව තිබිය යුතු බව

පස්වැන්නඃ ඔවුන් තමන්ට ඉගැන්වූ පාඩම සතුටින්පිළිගෙන ඒ ගැන ස්තුති වන්ත විය යුතු බව



අපි මෙ සියළු උපදෙස් පිළිගනිමු. අපි අපේ ගුරුතුමා ප්‍රිය කරමු; ඔහුට ගෞරව කරමු; අපේ දෙමාපියන්ට මෙන් ඔහුටද අප කෙරෙහි යම් අයිතිවාසිකම් ඇති බව අපි දනිමු.

**ප්‍රශ්න**

1. ඔබට කියවන්නටත් ලියන්නටත් උගැන්වූයේ කවුද?
2. ඔබ නොදන්නා දෑ ඔබට කියාදෙන්නේ කවුද?
3. මිනිස් වගෙහි ශ්‍රේෂ්ඨතම ගුරුවරයා කවුද?
4. අපේ පළමුවැනි ඉමාම් වරයා විසින් අපගේ පියා සහ අපගේ ගුරුවරයා ගැන අපට දෙනු ලැබ ඇති උපදෙස් මොනවාද?
5. අපගේ ගුරුවරයාගේ අයිතිවාසිකම් ගැන සිව් වැනි ඉමාම් වරයා විසින් කුමක් කියනු ලැබ ඇතිද?
6. ගුරුවරයා පංතිය තුළට පිවිසෙද්දී අපි කුමක් කළ යුතු වෙමුද?
7. ඔබගේ පංතියේ අය අතුරින් සතර වැනි ඉමාම් වරයා විසින් ගුරු වරයා ගැන දෙනු ලැබ ඇති උපදෙස් අනුව ක්‍රියාකරන්නේ කවුද?

**ඔබගේ ගුරුතුමාට ලිපියක් ලියා ඔහුට ස්තූති කරන්න.**

විසිඅට වැනි පාඩම

## වැදගත් සෞඛ්‍ය උපදෙසක්

වරෙක ක්‍රිස්තියානි වෛද්‍යවරයෙක් ඉමාම් සාදික් (රලි) ගෙන් මෙසේ විමසුවේය.

"ඔබගේ කුර්ආනයේ සහ නබිතුමාණන්ගේ උපදෙස් වල ශරීර සෞඛ්‍යය සම්බන්ධව කිසියම් දැයක් සඳහන් වී ඇත්ද?"



එවිට ඉමාම් සාදික් (රලි) ඔහුට මෙසේ පිළිතුරු දුනි.

"එසේය, කුර්ආනය මිනිසුනට මෙසේ පවසයි. " කැම බීම

පරිභෝජනය කරන්න. නමුත් කෑමේදීත්, බීමේදීත් පමණ ඉක්මවා නොයන්න.'' එසේම අපගේ නබිතුමා පවසා ඇති පරිදි බඩගිනි දැනෙන තෙක් නොසිට ආහාර ගැනීම රෝගයන්ට මඟ පාද ගැනීමයි. බුද්ධිය මෙහෙයවා සුළුවෙන් ආහාර ගැනීම සියළු ලෙඩ රෝග වලට පිලියමකි.''

එවිට ක්‍රිස්තියානි වෛද්‍යවරයා නැඟිට සිට මෙසේ පැවසුවේය.

''ඔබගේ කුර්ආනයේ අඩංගු වන්නේ ඉතාමත් යහපත් හා පිරිපුන් සෞඛ්‍යය උපදෙස්ය.

''ඔබගේ නබිතුමාණන්ගේ නිර්දේශයද ඉතාමත් බුද්ධිමත් එකකි.

අල්ලාහ් අපට කියන්නේ ''කෑමබීම පරිභෝජනය කරන්න නමුත් එසේ කිරීමේදී පමණ ඉක්මවා නොයන්න.'' යනුවෙනි.

**ප්‍රශ්ණ**

1. ක්‍රිස්තියානි වෛද්‍යවරයා ඉමාම් සාදික්( රලි) ගෙන් කුමක් විමසුවේද?

2. එවිට ඉමාම් සාදික් තුමා දුන් පිළිතුර කුමක්ද?

3. කුර්ආනයේ ඇති සෞඛ්‍යය උපදෙසක් විස්තර කරන්න.

4. නබිතුමානණ් ගේ සෞඛ්‍ය උපදෙසක් දක්වන්න.

5. කුස පිරී තිබියදී ආහාර ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵලය කුමක්ද?

6. ක්‍රිස්තියානි වෛද්‍යවරයා ඉමාම් සාදික්( රලි) කී දැය ඇසීමෙන් පසු කුමක් කීවේද?

7. ඉමාම් සාදික් තුමාගේ උපදේශය ඔබ අනුගමනය කරන්නේ කෙසේද?

**මෙ වාක්‍ය සම්පූර්ණ කරන්න.**

1. කුර්ආනය අපට මෙසේ පවසයි''.............................නමුත්

එසේ කිරීමේදී පමණ ඉක්මවා නොයන්න.''

2. බඩගිනි දැනෙන තෙක් නොසිට ...................... නිසා .................. ඇති වෙයි.

3. සුළුවෙන් ආහාර ගැනීම .............................කි.

4. අපගේ කුර්ආනයේ අඩංගු ............................ උපදෙස් ඉතාමත් .........හා .......................... දෑ වෙයි.

5. අපගේ නබි තුමාණන්ගේ නිර්දේශයද ඉතාමත් ....................
එකකි.

## විසිනව වැනි පාඩම

# වෙන්වීමේ දිනය

වසර අවසානයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාසැලෙන් ප්‍රගති වාර්තාවන් ලබා ගන්නා විට සමහර ළමයි ප්‍රීතිමත් වන්නෝය; සිනාසෙන්නෝය. ඔවුහු තමන්ගේ ප්‍රගති වාර්තා අනුන්ට පෙන්වති. සැම කෙනෙක්ම ඔවුන්ට සුබ පතන්නෝය. මේ ළමයි වෙහෙස වී වැඩ කිරීමෙන් සාර්ථකත්වය දිනාගෙන ඇත.

එලෙසින්ම සමහරක් ළමයින් තමන්ගේ ප්‍රගති වාර්තා දැකීමෙන් නොසතුටට පත් වන්නෝය. ලැජ්ජාවෙන් හිස පහත් කරගෙන ඔවුහු තමන්ටම මෙසේ කියා ගනිති.



''මම මගේ පාඩම් හොඳින් ඉගෙන ගත්තා නම්! .... මම මහන්සිව් පාසැලේ වැඩවල යෙදුණා නම් ....!''

උත්ථාන දිනයේදිත් සමහරෙක් සතුටින් සිනාසෙමින් තමන්ගේ ප්‍රගති වාර්තාවන් දකුණතින් ලබා ගන්නෝය. ඔවුහු ස්වර්ගයට යන උදවිය වන අතර යහපත් මිතුරන්, පලබර වුණ ගස්වලින් යුතු සරුසාර උයන් ආදියට උරුම ලද්දෝ වෙති.

ඔවුන්ගේ යහපත් හා සිත් ගන්නා සුළු ක්‍රියාවන් වෙනුවෙන් ඔවුන් ලබන තිලිණය ස්වර්ගයයි. නමුත් සමහර ශිෂ්‍යයන් තමන්ගේ ප්‍රගති වාර්තා ලබා ගන්නේ වම් අතිනි. ඔවුහු දුකට පත්ව හඬා වැළපෙන අතර, ලැජ්ජාවෙන් හිස්බර කරගෙන තමන්ටම මෙසේ කියා ගනිති. '' මා මේ ලෝකය තුළ යහපත් ලෙස ජීවත් වුණා නම් ! මගෙන් කිසිවෙකුට කරදරයක් නොවන්නට මම වග බලා ගත්තානම්!....''

මේ අය අපායට යන්නෝය. ඔවුන් ලබන්නේ වේදනාවන්, ගින්දරන් පමණයි. ඔවුන්ගේ අයහපත් හා කෘෘර ක්‍රියා වෙනුවෙන් ඔවුන් ලබන දඬුවම ගිනි දන අපායයි.

**උත්ථාන දිනය වෙන්වීමේ දිනයද වෙයි.**

**ප්‍රශ්ණ**

1. උත්ථාන දිනයේදී තමන්ගේ ප්‍රගති වාර්තා දකුණතින් ලබා ගන්නෝ                    කවුරුද?

2. තම ප්‍රගති වාර්තා වමතින් ලබා ගන්නට සිදුවන්නේ කාටද?

3. මේ මිනිස්සු තමන්ටම කුමක් කියා ගන්නෝද?

4. උත්ථාන දිනය ''වෙන්වීමේ දිනය'' යනුවෙන් හැඳින්වෙන්නේ ඇයි?

**මේ වාක්‍යය සම්පූර්ණ කරන්න**

1. උත්ථාන දිනයේදී සිත් ගන්නා සුළු ක්‍රියාවන්හි යෙදුණ අය ප්‍රීතිමත්

වන්නෝය............ඔවුහු................ට යන උදවිය වන අතර......................සහ ......................ආදියට උරුම ලබති.

2. උත්ථාන දිනයේදී කෲර සහ අනුන්ට කරදර කරමින් ජීවත්වුණ අය දුකට පත්ව................අතර .......................නිසා ................පහත් කර ගෙන තමන්ටම මෙසේ කියාගනිති"..................."................................නම්..................නම්"

මෙ අය අපායට යන්නෝය. ඔවුන් ලබන්නේ ........................න් ..................න් පමණයි.